# රණවිරුවා



දෙරණ, ගුවන, දියඹ සිසාරා පෑ
රණකාමී අභිමානය

## දියකාවා
## යුද මෙහෙයුම

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, කොළඹ 03

2019 සැප්තැම්බර්, 209 කලාපය

# දියකාවා යුද අභ්‍යාසය

## [ඒකාබද්ධ ක්ෂේත්‍ර යුද අභ්‍යාසය]



ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මගින් දහවන වරටත් සංවිධානය කරනු ලැබූ "දියකාවා යුද අභ්‍යාසය අධියර X 2019" (ඒකාබද්ධ ක්ෂේත්‍ර යුද අභ්‍යාසය) ශ්‍රී ලංකා හමුදා භටයින් සහ විදේශීය හමුදා භටයින් සමඟ එක්ව පසුගිය සැප්තැම්බර් මස 03 දින සිට 23 දින දක්වා සාර්ථකව දියත් කරනු ලැබීය.

මෙම යුද අභ්‍යාසය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කමාන්ඩෝ, විශේෂ බළකා, පාබල හමුදා සහ යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවලට අයත් සෙබලු 2400 ක්, නාවික හමුදා සෙබලු 400 ක්, ගුවන් හමුදා සෙබලු 200 ක් සහ විදේශීය හමුදා සාමාජිකයින් 80 ක් සහභාගී වූහ. මෙම ඒකාබද්ධ යුද අභ්‍යාස පුහුණුව ත්‍රිකුණාමලය, මහනුවර, වික්ටෝරියා වේල්ල, පුල්මුඩේ, නිප්පානිතන්කුලම්, නිලාවේලි, ඉබ්බන්කටුව ජලාශය, කොළඹ, සීගිරිය, ගෝමරන්කඩවල, වඩුමුනේ, කොළඹ 07 පිහිටි බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, මන්නාරම, බලපිටිය, මදුරන්කේනිකුලම්, කායන්කනි, ඉලුප්පෙයිකඩවායි, නාරකමුල්ල සහ නුවරඑළිය ප්‍රදේශයන්හි පුහුණු මෙහෙයුම් පවත්වා අවසන් යුද අභ්‍යාසය කුච්චවේලි වෙරළ තීරයේදී දියත් කරනු ලැබීය.

ඒ අනුව මෙම මෙහෙයුම මැලේසියාව, මාලදිවයින, නේපාලය, රුසියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, බංග්ලාදේශය, චීනය, ප්‍රංශය, ඉන්දියාව, ඉරානය, පාකිස්ථානය, එකසත් රාජධානිය සහ සිම්බාබ්වේ යන රටවල්හි විදේශීය හමුදා නියෝජිතයින් සමඟ සමීප සහයෝගීතාවයෙන් යුතුව සති තුනකට අධික කාලයක් පුරා සාර්ථකව සිදුකරන ලදී.

මෙම යුද අභ්‍යාසයේ අවසන් ප්‍රහාරය දියත්කළ අවස්ථාව නැරඹීම සඳහා ප්‍රධාන අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ආරාධනයෙන් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන අද්මිරාල් රවීන්ද්‍ර සී විජේගුණරත්න ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විඑස්වී යූඑස්පී එන්අයි(එම්) සහභාගී විය. තවද ගුවන් හා නාවික හමුදාපතිවරු, ත්‍රිවිධ හමුදා සාමාජිකයින්, රාජ්‍ය නිලධාරීන්, මාධ්‍යවේදීන් ඇතුළු විශාල පිරිසක් ද ඊට එක්වූහ. විශේෂ මෙහෙයුම් සඳහා සහභාගී වන භටපිරිස්වල කාර්යක්ෂමතාව සහ ඔවුන්ගේ ක්‍රියාන්විත සූදානම වැඩිදියුණු කිරීම මෙම අභ්‍යාසයේ ප්‍රධානතම ඉලක්කය වේ.



# යුද්ධ හමුදාධිපති යාපනයේ සංචාරයක

යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සිය ධුරයේ වැඩ භාරගැනීමෙන් අනතුරුව පසුගිය සැප්තැම්බර් මස 21 දින යාපනය ආරක්ෂක සේනා මූලස්ථානයේ පළමු නිල සංචාරයේ නිරත විය. එහිදී එම අවස්ථාවට සමගාමීව යාපනය අර්ධද්වීපයේ අඩු ආදායම්ලාභී පවුල්වල සිසු දරුදැරියන් වෙත පාපැදි 400 ක් හා ආර්ථික වටිනාකමකින් යුත් පැළ තොගයක් බෙදාදීමද යාපනය ආරක්ෂක සේනා මූලස්ථානයේදී සිදුකරන ලදී. එම අවස්ථාවට යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය වීඑස්වී යූඑස්පී එන්ඩියූ යූඑස්ඒසීපීඑස්සී ඇතුලු විශාල පිරිසක් ද සහභාගී වූහ.













# ස්වේච්ඡා බළසේනා අත්පන්දු හා දැල්පන්දු තරගාවලිය 2019

යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාව මගින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන අන්තර් රෙජිමේන්තු වොලිබෝල් හා අන්තර් ඒකක නෙට්බෝල් තරගාවලිය ඉකුත් සැප්තැම්බර් මස 23, 24 හා 25 යන දිනයන්හිදී කොළඹ සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගනයේදී පැවැත්විණ. එහි අවසන් දින උත්සවය සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් එන්ජ් ධර්මරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගී විය.



දින තුනක් පුරා පැවැත්වූ මෙම වොලිබෝල් සහ දැත්පන්දු තරගාවලියට පිරිමි කණ්ඩායම් 20 ක් හා කාන්තා කණ්ඩායම් 05 තරග වැදුනහ. එහිදී වොලිබෝල් පිරිමි ශූරතාවය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු කණ්ඩායමද, අනුශූරතාව ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු කණ්ඩායමද හිමිකර ගත්හ. එහි කාන්තා ශූරතාවය 4 වන කාන්තා බළකායටද, අනුශූරතාවය ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බළකායටද හිමිවිය.

ස්වේච්ඡා බළසේනාවට අයත් ඒකක නියෝජනය කරන සියලු රෙජිමේන්තුවල ක්‍රීඩක ක්‍රීඩිකාවන් විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් සංවිධානය කෙරුණු මෙම තරගාවලිය අතිශය විචිත්‍රවුත් තරගකාරීවුත් එකක් විය.

ස්වේච්ඡා බළසේනාව වසරක් තුළ සංවිධානය කරනු ලබන දැවැන්තම ක්‍රීඩා සැණකෙළියක් වූ එමගින් ජාතික හා ජාත්‍යන්තර කෙළිබිම දිගවිජය කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන් රැසක් මේ වන විටත් බිහිව තිබේ.













# ඉතසිතින් සුබ පැතුම්

මෑතකදී මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලද ජ්‍යෙෂ්ඨ නිලධාරීහු ඉකුත් සැප්තැම්බර් 12 දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවූහ. එසේ නව උසස්වීම් ලැබූ නිලධාරීන් වනුයේ පර්යේෂණ හා සංවර්ධන අධ්‍යක්ෂක මණ්ඩලයේ අධ්‍යක්ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් ඩීපී ධර්මසිරි යූඑස්පී එච්ඩීඑම්සී, 62 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජේඑම්යූඩී ජයසිංහ, ඉදිරි නඩත්තු පෙදෙස මුලතිව් ආඥාපති මේජර් ජෙනරාල් සීකේ හඳුන්මුල්ල, යුද්ධ හමුදා ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජෙනරාල් සහ ආරක්ෂක අමාත්‍යාංශයේ මාධ්‍ය කේන්ද්‍රයේ අධ්‍යක්ෂක හා හමුදා මාධ්‍ය ප්‍රකාශක මේජර් ජෙනරාල් ඒඑම්එස්බී අතපත්තු, ඉදිරි නඩත්තු පෙදෙස කිලිනොච්චි ආඥාපති මේජර් ජෙනරාල් ඒඩී ඇල්වත්ත හා 21 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒඅයි මාරසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වෙති. නව උසස්වීම් ලැබූ නිලධාරීන්ට රණවිරුවා තුළින් අපිද සුබ පතන්නෙමු.

# සංචාරයක සටහන්

යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් සැප්තැම්බර් මස 08 දින මින්නේරිය පාබල පුහුණු මධ්‍යස්ථානයේ සංචාරයක නිරත විය. එම මධ්‍යස්ථානයේ සේනාවිධායක මේජර් ජෙනරාල් පීජේ ගමගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී ගේ ආරාධනයකට අනුව එහි සපැමිණි යුද්ධ හමුදාධිපතිතුමන් එහිදී උණුසුම් අයුරින් පිළිගනු ලැබීය. සංචාරය අතරතුර යුද්ධ හමුදාධිපති එහි පුහුණුව ලබන 500 කට අධික භට පිරිසක් ඇමතීමටද කටයුතු කළේය. එහිදී යුද්ධයේ දී සහ රටේ ආරක්ෂාව වෙනුවෙන් පාබල සහ ඒ ආශ්‍රිත මෙහෙයුම් පිළිබඳව අධ්‍යනය කිරීමේ වැදගත්කම ද යුද්ධ හමුදාධිපති සිය දේශනය තුළින් අවධාරණය කළේය. එම සංචාරය සිහිවීම වස් පාබල පුහුණු මධ්‍යස්ථානයේ සේනාවිධායක විසින් යුද්ධ හමුදාධිපතිතුමා වෙත සමරු තිළිණයක්ද ප්‍රදානය කරන ලදී.












ශ්‍රී ලංකා යුද්ධ හමුදා ගජබා රෙජිමේන්තුව, ශ්‍රී ලංකා මෝටර් රථ සහ යතුරුපැදි ධාවකයින්ගේ සංගමය (SLADA) සමඟ එක්ව සංවිධානය කළ "ගජබා සුපර්ක්‍රොස් - 2019" මෝටර් රථ හා යතුරුපැදි ධාවන තරගාවලිය ඉකුත් සැප්තැම්බර් 01 දින සාලියපුර ගජබා රෙජිමේන්තු මූලස්ථාන ධාවන පථයේදී පැවැත්විණ. එම තරගාවලියේ සාර්ථකත්වය පිටුපස සිටි ශක්තිය වූ ගජබා රෙජිමේන්තුවේ අධිපති මෙන්ම වත්මන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී මෙවර තරගාවලියේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ අතර, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනී සුජීවා නෙල්සන් මහත්මියද ඊට එක්වූවාය.




"ගජබා සුපර්ක්‍රොස් - 2019" රජරට පළාතේ පැවැත්වෙන දැවැන්තම තරගාවලියක් ලෙස සැලකෙන අතර ඊට අවුරුදු 10, 13 හා 15 වයස් කාණ්ඩ යටතේ වෙන් වෙන්ව පැවති තරඟ ඉසව්වලට අමතරව මෝටර් රථ ධාවන තරඟ ඉසව් 12 ක් සහ යතුරුපැදි ධාවන තරඟ ඉසව් 12 ක් ද ඇතුළත් විය. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ගුවන් කරණම්කරුවන් 11 දෙනෙකු මෙම දැවැන්ත උත්සවය වර්ණවත් කළ අතර මෑතකදී පැරෂුට් අනතුරකින් සිය ජීවිතය අහිමි වූ යුද්ධ හමුදාවේ බලලත් නිලධාරී චම්පික කුමාරසිංහගේ වෙත උපහාර දැක්වීමක් ලෙස ඔහුගේ සොහොයුරාට රුපියල් ලක්ෂයක චෙක් පතක් ද එහිදී ප්‍රදානය කළේය. "ගජබා සුපර්ක්‍රොස් - 2019" තරගාවලියෙන් ලැබෙන මුදල් ප්‍රතිපාදන එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා මෙන්ම ගජබා රෙජිමේන්තුවේ සේවයේ නියුතු හා ආබාධිත රණවිරුවන්ගේ ද මියගිය රණවිරුවන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ ද සුබසාධන කටයුතු සඳහා යොදවනු ලබයි.





# දුලබ හමුවක සුහද කතාබහ

ශ්‍රී ලංකාවේ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක කපිතාන් අශෝක් කෝටේශ්වර රාඕ ඉකුත් සැප්තැම්බර් මස 05 දින හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවිය. යුද්ධ හමුදාධිපතිතුමන් එම තනතුරේ රාජකාරි භාරගැනීමෙන් අනතුරුව යුද්ධ හමුදා මූලස්ථානයට කැඳවූ පළමු විදේශ නියෝජිතයා ඔහු වීම විශේෂත්වයකි.





කොළඹ ආරක්ෂක සම්මන්ත්‍රණය - 2019 සැසිවාරය සඳහා සහභාගි වූ නේපාලයේ යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන ලුතිනන් ජෙනරාල් ගෞරව් තන්ඩුල් ඉකුත් අගෝස්තු මස 29 දින එම සම්මන්ත්‍රණය අතරතුර බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ ප්‍රභූ සාකච්ඡා ශාලාවේදී යුද්ධ හමුදාධිපති හමුවූ අවස්ථාව.



කොළඹ ආරක්ෂක සම්මන්ත්‍රණයට සහභාගිවීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණි මාලදිවයින් ආරක්ෂක හමුදා ප්‍රධාන මේජර් ජෙනරාල් අබ්දුල්ලා ෂමාල් යුද්ධ හමුදාධිපති තුමන් හමුවූ අවස්ථාව.

# පරිසරවේදීන්ට යුද්ධ හමුදාධිපතිගෙන් පැසසුම්



කොහුවල විට්ලිෆ් රංගකලා අධ්‍යයන ආයතනයේ අධ්‍යාපනය හදාරන ළමුන් පිරිසක් ඉකුත් සැප්තැම්බර් 18 දින යුද්ධ හමුදා මූලස්ථානයේ දී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවූහ. එහිදී ඔවුන් විසින් පරිසරයේ තිරසාරභාවය සඳහා සුවිශේෂී ව්‍යාපෘතියක් වන "තුරුලිය වෙනුවෙන් අපි" ව්‍යාපෘතිය සඳහා රුපියල් ලක්ෂ 2 ක වටිනාකමකින් යුතු ජලය රඳවා තබාගැනීමේ මැටි මුට්ටි සහ මූල්‍ය පරිත්‍යාගයක් සිදුකරනු ලැබීය.

එම එක් මැටි මුට්ටියක ජලය ලීටර් 07 ක් පමණ රඳවා ගතහැකි අතර, එහිදී ඔවුන් ප්‍රදානය කළ මැටි භාජන ප්‍රමාණය 1000 කි. එම භාජන ජලයෙන් පුරවා ශාක දෙපස වැළලීමෙන් ජලය දිගුකාලීනව ශාකයට උරාගැනීමටත් ඒ තුළින් වියළි කාලගුණයන්හිදී පවා ජල ගැටලුවට පිළියමක් ලැබේ.

# යුද්ධ හමුදාධිපති අකුරේගොඩ නව යුද්ධ හමුදා මූලස්ථානයේ සංචාරයක



යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් සැප්තැම්බර් මස 17 දින අකුරේගොඩ අභිනවයෙන් ඉදිකෙරෙමින් පවතින යුද්ධ හමුදා මූලස්ථාන සංකීර්ණයේ නිරීක්ෂණ චාරිකාවක නිරත විය. එහිදී යුද්ධ හමුදාව වෙනුවෙන් වෙන්කෙරෙන කාණ්ඩ 6 සහ 7 කඩිනමින් නිමකර යුද්ධ හමුදාවට එහි ස්ථානගතවීමට අවශ්‍ය ඉදිරි කටයුතු සැලසීම පිළිබඳ එහිදී යුද්ධ හමුදාධිපතිතුමා උපදෙස් ලබාදෙන ලදී.

# නර්තන ශිල්පීන් යුද්ධ හමුදාධිපතිගේ ඇගයුමට

රුසියාවේදී පැවති "ජාත්‍යන්තර යුද්ධ හමුදා ක්‍රීඩා උළෙල - 2019" හි සංස්කෘතික අංශයේ ප්‍රථම ස්ථානය හිමිකර ගනිමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ධජය ඉහළට එසවීමට යුද්ධ හමුදා නර්තන ශිල්පීන් තිදෙනෙක් සමත්වූහ. රටවල් 39 ක තරඟකරුවන් අභිබවමින් තරඹන්නන් විශ්මයට පත්කොට එම අද්විතීය හැකියාවන් ප්‍රදර්ශනය කරන ලද්දේ ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායේ කෝප්‍රල් රාජප්‍රිය එස්කේඩී, කෝප්‍රල් රංග කුමාර සහ කෝප්‍රල් බෙලිගල බීජී යන රණවිරුවන්ය.
පසුගියදා යුද්ධ හමුදා මූලස්ථානයේදී එකී විස්කම් පෑ රණවිරුවන් හමුවූ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඔවුන්ව මහත්සේ ඇගයීමට ලක්කළේය.



# නිර්භීත විරුවන්ට යුද්ධ හමුදාධිපතිගෙන් ප්‍රශංසා

කිලිනොච්චි ආරක්ෂක සේනා මූලස්ථානය යටතේ ස්ථාපිත 66 වන සේනාංකයේ සේවයේ නියුතු ලා/කෝ අමරසිරි ඩීජීඑස් සහ ලා/කෝ ආරියරත්න ටීජීජේපී යන සෙබලු දෙදෙනා ඉකුත් සැප්තැම්බර් මස 07 දිනදී එම ප්‍රදේශයේ වූ අරසපුරකුලම් වැවෙහි ගිලෙමින් සිටි දරුවන් දෙදෙනෙකුගේ සහ කාන්තාවකගේ දිවි ගලවාගැනීමට සමත්වූහ. එහිදී තමන්ට සිදුවිය හැකි අනතුර ගැන ද නොසිතමින් වැව් දියේ ගිලෙමින් සිටි එම පිරිස බේරාගනිමින් එම සෙබලුන් දෙදෙනා පෙන්වූ නිර්භීතභාවය යුද්ධ හමුදාවේ අභිමානයට හේතුවකි.

එම නිර්භීතවූත් මානුෂීයවූත් ක්‍රියාව අගයමින් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඔවුන් දෙදෙනා විශේෂ ඇගයීමකට ලක්කළ අතර, ඔවුන් වෙත විශේෂ සමරු තිළිණ සහ සහතිකපත් ප්‍රදානයක්ද සිදුකරන ලදී. ඔවුන්ගේ මෙම එඩිතර ක්‍රියාව තුළින් රට ජාතිය වෙනුවෙන් යුද්ධ හමුදාව ඕනෑම අභියෝගයකට මුහුණ දීමට සූදානම් බව පිළිබිඹු වන්නේ යැයි එහිදී යුද්ධ හමුදාධිපතිතුමන් පසක්කර සිටියේය.







## ඉන්දීය විරුවන් සිහිකෙරේ



1987 වර්ෂයේ සිට 1990 වර්ෂය දක්වා ශ්‍රී ලංකාවේදී මියගිය ඉන්දීය සෙබලුන් සිහිපත් කිරීම වෙනුවෙන් පුෂ්පෝපහාර දැක්වීමේ උත්සවයක් ඉන්දීය කොන්සල් ජෙනරාල් එස් බාලචන්ද්‍රන් මහතාගේ ප්‍රධානත්වයෙන් ඉකුත් අගෝස්තු මස 15 දින පලාලි හි පිහිටි ඉන්දීය රණවිරු ස්මාරකය අභියසදී පවත්වන ලදී. 73 වන ඉන්දීය නිදහස් දිනයට සමගාමීව සිදුකෙරුණු මෙම කටයුත්තට යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය ඩබ්ලිව්ඩබ්ලිව්වී සහ ශ්‍රී ලංකා නිලධාරීන් හා සෙසුනිලයින් රැසක්ද සහභාගි වූහ.

## විරු සවියෙන් දිනු සෙවණක්







පුන්කුඩුතිව් ප්‍රදේශයේ දිළිඳු පවුල් සඳහා නිවාස අධිකාරියේ මූල්‍යමය දායකත්වය මත ඉදිකරමින් පවතින නිවාසවල ඉදිකිරීම් කටයුතු පරීක්ෂා කිරීම සඳහා යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය ඩබ්ලිව්ඩබ්ලිව්වී ශ්‍රී ලංකා ඉකුත් අගෝස්තු මස 14 දින එම ප්‍රදේශයේ සංචාරයක නිරත විය. එම අවස්ථාවට උතුරු පළාත් අධ්‍යාපන ලේකම් අයි. ඉලංගෝවන් මහතාද එක්වූ අතර, එහිදී ඔවුන් නිවාස සාදා නිමකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාගැනීමට සහ කඩිනමින් ඒවා ජනතා අයිතියට පත්කිරීම පිළිබඳව සාකච්ඡාවකද නිරත විය. එම නිවාස ඉදිකිරීමේ සියලු ශ්‍රම දායකත්වය සපයනු ලබන්නේ යුද්ධ හමුදාව මගිනි.

# අන්තර් සේනාංක ස්කොච් තරඟාවලිය - 2019



"අන්තර් සේනාංක ස්කොච් තරඟාවලිය - 2019" පසුගිය අගෝස්තු 05 දින අසේමු (වන්නි) ස්කොච් ක්‍රීඩාංගනයේදී පැවැත්විණි. මෙම තරඟාවලිය සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) යටතේ පාලනය වන 21, 54, 61 හා 62 සේනාංක මෙන්ම ඉදිරි නඩත්තු පෙදෙස (උ/මැ) වෙතින් කණ්ඩායම් 07 ක් සහභාගී වූහ. එහි අවසන් මහා තරඟය සඳහා 21 සේමු සහ 62 සේමු කණ්ඩායම් සුදුසුකම් ලැබූ අතර, ඉන් 21 සේනාංක මූලස්ථාන කණ්ඩායම ජයග්‍රහණය හිමිකරගන්නා ලදී.

සමස්ත තරඟාවලියේ දක්ෂතම ක්‍රීඩකයාට හිමි සම්මානය 21 සේනාංකය නියෝජනය කරමින් තරඟ කළ 2(සෙව්) විජාරෙ ඒකකයට අයත් සෙ/02190 කෝප්‍රල් ජයකොඩි ඩීඑම්එස් විසින් දිනාගත් අතර, අනුශූරතාව 62 සේනාංකය විසින් හිමිකර ගන්නා ලදී. මෙම තරඟාවලියේ අවසන් දින ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස වන්නි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේඑස් ගුණවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගී වූ අතර, 21, 54, 56, 61 හා 62 සේනාංකයන්හි සේනාංකාධිපතිවරු, ඉදිරි නඩත්තු පෙදෙස (උ/මැ) ආඥාපති, බළසේනාධිපතිවරු ඇතුළු නිලධාරීන් හා සෙසුනිලයින් විශාල පිරිසක් ද ඊට එක්වූහ.





# රණවිරුවන්ට ආත්මාරක්ෂක සටන් කලා පාඨමාලාවක්



ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ආඥාපති ගේ උපදෙස් හා මගපෙන්වීම මත එම ආරක්ෂක සේනා මූලස්ථානය හා ඒ යටතේ පාලනය වන සේනාංක, බළසේනා හා ඒකකයන්හි රාජකාරී කරනු ලබන නිලධාරීන් හා සෙසුනිලයින් හට ආත්මාරක්ෂක සටන් කලාවක් වන කියෝෂිරියු බුදෝ සටන් කලා පාඨමාලාවක් ඉකුත් අගෝස්තු මස 01 දින එම මූලස්ථානය වන්නි හිදී ආරම්භ කරන ලදී. මෙම පාඨමාලාවේ ප්‍රධාන උපදේශක වශයෙන් ශ්‍රී ලංකාවේ දක්ෂ බුදෝ සටන් කලා උපදේශකයෙකු වන කළුපටි 08 වන ශ්‍රේණිධාරී රෙන්ෂි ක්ලෙමර්ට් ද සොයිසා මහතා කටයුතු කරන අතර, ඒ මහතාගේ උපදේශකත්වයෙන් යුද්ධ හමුදා උපදේශකයින් පිරිසක් විසින් ඉගැන්වීම් කටයුතු සිදුකරනු ලැබීය. පාඨමාලාව සඳහා නිලධාරීන් 25 ක් හා සෙබලුන් 1000 ක පිරිසක් වැඩ කරන දින 15 ක් පුරා පුහුණුවීම් කටයුතු සිදුකරන ලදී. ඉදිරියේදී මෙම සටන් කලාව ආරක්ෂක සේනා මූලස්ථානය වන්නි බළප්‍රදේශය තුළ රාජකාරී කරනු ලබන තවත් 2000 ක හට පිරිසකට පුහුණු කිරීම් සඳහා යොමු කිරීමට ආඥාපති විසින් උපදෙස් ලබාදී ඇත.

ඉකුත් අගෝස්තු මස 17 දින මෙම සටන් කලා පාඨමාලාව හදාරන ලද සාමාජිකයින්ගේ විසිරයාමේ උත්සවය උත්කර්ෂවත්ව පවත්වන ලද අතර එම අවස්ථාවට වන්නි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේඑස් ගුණවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, බුදෝ ප්‍රධාන උපදේශක, 21, 54 සහ 61 සේනාංකයන්හි සේනාංකාධිපතිවරු, අනෙකුත් නිලධාරීන් සහ සෙසුනිලයින් විශාල පිරිසක් සහභාගී වූහ.



# යුද්ධ හමුදාධිපති නැගෙනහිර සංචාරයක

ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සිය ධූරයේ රාජකාරි භාරගැනීමෙන් අනතුරුව ඉකුත් සැප්තැම්බර් මස 08 දින නැගෙනහිර ආරක්ෂක සේනා මූලස්ථානයෙහි සිය පළමු නිල සංචාරය සිදුකරන ලදී. එහිදී නැගෙනහිර ආරක්ෂක සේනා අධිපති මේජර් ජෙනරාල් කේපීඑ ජයසේකර ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී වීඑස්වී යූඑස්පී ඇතුලු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් යුද්ධ හමුදාධිපතිතුමා උණුසුම් අයුරින් පිළිගැනීමෙන් අනතුරුව හමුදා සම්ප්‍රදායානුකූල කඳවුරු සම්මාන මුරයක් හා සම්මාන ආචාර පෙළපාලියක් ද පිරිනමනු ලැබීය. සිය සංචාරය අතරතුර යුද්ධ හමුදාධිපතිතුමන් නැගෙනහිර ආරක්ෂක සේනා මූලස්ථානයට අයත් සියලුම සේනාංක හා බලසේනා මෙන්ම ඉදිරි නඩත්තු පෙදෙස - නැගෙනහිර යටතේ රාජකාරි නියුතු නිලධාරීන් සහ සෙසුනිලයින් අමතන්නටද අමතක නොකළේය. එහිදී පාස්කු ප්‍රහාරයෙන් පසුව කැපවීමෙන් කටයුතු කරමින් ප්‍රදේශයේ සාමය සහ සංහිඳියාව ගොඩනැගීම සඳහා හටපිරිස් දැක්වූ දායකත්වය යුද්ධ හමුදාධිපතිතුමා විසින් විශේෂ ඇගයුමට ලක් කළේය. එමෙන්ම එතුමන් සියලුම සේනාංකාධිපතිවරුන් සහ බලසේනාධිපතිවරුන් සමඟ ප්‍රදේශයේ වත්මන් ආරක්ෂක තත්ත්වය සහ හටපිරිස් සමඟ කටයුතු කිරීමේදී ඔවුන්ගේ කාර්යභාරය පිළිබඳවද සුහදව අදහස් හුවමාරු කරගන්නා ලදී.





# අන්තර් සේනාංක මළල ක්‍රීඩා උළෙල - 2019




යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් සංවිධානය කෙරුණු "අන්තර් සේනාංක මළල ක්‍රීඩා උළෙල" 2019 සැප්තැම්බර් මස 21 දින වැලිකන්ද ආරක්ෂක සේනා මූලස්ථාන ක්‍රීඩාංගනයේදී අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණි. මෙම ක්‍රීඩා උළෙල සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) ට අයත් 22, 23 හා 24 සේනාංකයන් හා ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 400 කට අධික පිරිසක් සහභාගී වූහ. එහි සමාප්ති උළෙලේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සපැමිණි නැගෙනහිර ආරක්ෂක සේනා අධිපති මේජර් ජෙනරාල් කේපීඑ ජයසේකර ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී වීඑස්වී යූඑස්පී අතින් තරඟාවලියේ ශූරතාව 22 වන සේනාංකයටද, අනුශූරතාව 23 වන සේනාංකයටද ප්‍රදානය කරන ලදී. එහිදී සමස්ත තරඟාවලියේ හොඳම මළල ක්‍රීඩකයාට හිමි සම්මානය 15 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ කෝප්‍රල් ද සිල්වා එස්ටීජේ විසින් හිමිකරගත් අතර, 2 (සේවා) ශ්‍රී ලංකා සංඥා බලකායේ අකාසෙ සේනාරත්න ඊජීඑස්එච් විසින් තරඟාවලියේ හොඳම මළල ක්‍රීඩිකාවට හිමි සම්මානය දිනාගන්නා ලදී.

# සිප්සතර ලැබුමට සවියක්







ආරක්‍ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චිය) බලප්‍රදේශයට අයත් වඩ්ඩකච්චි ප්‍රාථමික පාසල හා මුරුක්කානන්ත ප්‍රාථමික පාසල වෙත ගොඩනැගිලි සංකීර්ණ දෙකක් ඉදිකර ඉකුත් සැප්තැම්බර් 12 දින සිසු අයිතියට පත්කරන ලදී. එම ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයෙන් රුපියල් මිලියන 10.7 ක් වැයකර ඇති අතර, 11 වන ඉංජිනේරු සේවා බළකාය, 6 වන සිංහ රෙජිමේන්තුව හා 14 වන ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුවට අයත් භටපිරිස් ඒ සඳහා තාක්‍ෂණික සහය හා ශ්‍රම දායකත්වය ලබාදී තිබුණි. අදාල ගොඩනැගිලි විවෘත කිරීමේ අවස්ථාවට ප්‍රධාන ආරාධිතයින් ලෙස උතුරු පළාත් ආණ්ඩුකාරතුමා සමගින් කිලිනොච්චි ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ජීවී රවිප්‍රිය ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී එන්ඩියූ අයිජී ද එක්වූහ.

# කෙඩෙට් නිලධාරීන්ගේ සංචාරයක්








ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යා පීඨයේ කෙඩෙට් නිලධාරී පාඨමාලා - අංක 87 යටතේ පුහුණුව ලබන කෙඩෙට් නිලධාරීන් 39 දෙනෙකු ඔවුන්ගේ පාඨමාලාවේ එක් අදියරක් ලෙස ඉකුත් අගෝස්තු මස 27 දින කිලිනොච්චි ආරක්‍ෂක සේනා මූලස්ථානයේ සංචාරයක නිරත වූහ.

එහිදී කිලිනොච්චි ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ජීවී රවිප්‍රිය ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී එන්ඩියූ අයිජී නියෝජනය කරමින් එම මූලස්ථානයේ බ්‍රිගේඩියර් පාලන/හකාස බ්‍රිගේඩියර් එච්එම්එන් හේරත් විසින් ඔවුන්ව ඉතා උණුසුම් අයුරින් පිළිගන්නා ලද අතර එහි ප්‍රධාන මාණ්ඩලික නිලධාරී 11 (පුහුණු) විසින් ආරක්‍ෂක සේනා මූලස්ථානයේ ඉතිහාසය, කාර්යභාරය හා වගකීම පිළිබඳ සවිස්තරාත්මක ඉදිරිපත් කිරීමක් ද සිදුකරන ලදී.

# සංචාරයක සටහන්

මුලතිව් ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේ සෙනෙවිරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සිය තනතුරෙහි වැඩ භාරගැනීමෙන් අනතුරුව පසුගියදා 64 වන සේනාංකයේ සංචාරයක නිරත විය. එහි සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීසීකේ කොස්තා ආර්එස්පී යූඑස්පී ඇතුලු බලසේනාධිපතිවරුන් හා ඒකක අණදෙන නිලධාරිවරුන්ගෙන් ආඥාපති වෙත හිමිවූයේ උණුසුම් පිළිගැනීමකි. එහිදී ආඥාපති විසින් එහි හටපිරිස් ඇමතීමටද අමතක නොකළේය.







# කෙඩෙට් නිලධාරීන්ගේ සංචාරයක්

දියතලාව යුද්ධ හමුදා විද්‍යා පීඨයේ මූලික පුහුණුව ලබන කෙඩෙට් නිලධාරීන් 36 දෙනෙකු ඔවුන්ගේ උපදේශකයන් සමඟ ඉකුත් සැප්තැම්බර් මස 27 දින මුලතිව් ආරක්‍ෂක සේනා මූලස්ථානයෙහි චාරිකාවක නිරතවූහ. එහිදී ඔවුන් වෙත අවසන් මානුෂීය මෙහෙයුම පිළිබඳ සවිස්තරාත්මකව දැනුවත් කිරීමක්ද සිදුකරන ලද අතර, ඒ සඳහා මේජර් චන්දන කාරියවසම්, මේජර් රුක්ෂාන් උස්හෙට්ටිගේ, මේජර් තිලිණ හපුරුගල යන නිලධාරීහු දේශන සභාය දැක්වූහ.







# සංචාරයක සටහන්

බටහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ විසින් 58 වන සේනාංකයෙහි සහ ඒ යටතේ පාලනය වන බලසේනා හා ඒකකයන්හි ප්‍රථම කඳවුරු සංචාරය ඉකුත් ජූලි මස 26 දින සිදුකරන ලදී. එහිදී ආඥාපති විසින් එහි භටපිරිස් ඇමතීමටද කටයුතු කරන ලද අතර, අනතුරුව 58 සේනාංකයෙහි අභිනවයෙන් ඉදිකරන ලද ටෙනිස් පිටියද එහි සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්එම්ජේකේ ගුණරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ ආරාධනයෙන් සුබ මොහොතින් විවෘත කරන ලදී. පසුව 3(සෙව) ගැමුණු හේවා බලකාය සහ 14(සෙව) ගැමුණු හේවා බලකායද ආඥාපතිගේ නිරීක්ෂණයට බඳුන්විය.







# මාහැඟි සත්කාරයක්

2019 ඔක්තෝබර් 01 දිනට යෙදෙන වැඩිහිටි දිනය හා 70 වන යුද්ධ හමුදා දිනයට සමගාමීව කඩුවෙල පිහිටි විල්බට් පෙරේරා වැඩිහිටි නිවාසය වෙත සත්කාරක වැඩසටහනක් ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) සියලු නිලයින්ගේ දායකත්වයෙන් සිදුකරන ලදී. එහිදී යුද්ධ හමුදා රෝහල - පනාගොඩ වෙතින් සහභාගී වූ වෛද්‍ය නිලධාරියෙකු ඇතුලු වෛද්‍ය කණ්ඩායමක් විසින් වැඩිහිටියන්ගේ සෞඛ්‍ය තත්ත්වය පරීක්‍ෂා කිරීම සහ අවශ්‍ය බෙහෙත් ද්‍රව්‍ය ලබාදීම සිදුකරන ලදී. එසේම ඔවුන් වෙත දිවා ආහාරය ලබාදීමටද, පරිත්‍යාග බෙදාදීමටද, කැලිප්සෝ සංගීත කණ්ඩායමක් ලවා ඔවුන්ගේ රසාස්වාදය වෙනුවෙන් සංගීත වැඩසටහනක් පැවැත්වීමටද සංවිධායකයින් කටයුතු කරන ලදී. තවද එම වැඩිහිටි නිවාසය පිරිසිදු කිරීම, දිරාපත්ව පැවති වහලය සහ වැසිකිලි,කැසිකිලි පද්ධතිය නවීකරණය කිරීමද එම භටපිරිස් විසින් සිදුකළහ. බටහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ උපදෙස් හා මගපෙන්වීම යටතේ බ්‍රිගේඩියර් ඩීඑම්යූජී බණ්ඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී සහ බ්‍රිගේඩියර් අයිජී කඳනාආරච්චි ගේ අධීක්‍ෂණය යටතේ මෙම සත්කාරය සිදුකෙරිණ.





# රුක් රෝපණයට රණවිරුවන් මුල්වෙයි





ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) බලප්‍රදේශයට අයත් වික්ටෝරියා ජලාශයේ ජල පෝෂක කලාපය තුළ දියත් කෙරුණු රුක් රෝපණ වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර් 10 හා 11 යන දෙදින තුළ සිදුකෙරිණ. මේ සඳහා ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය විසින් කරන ලද ඉල්ලීමකට අනුව ශ්‍රී ලංකා රයිෆල් බළකායේ භට පිරිස් හා වික්ටෝරියා විදුලිබල දෙපාර්තමේන්තුවේ රාජකාරී කරනු ලබන සේවක පිරිසක් සහභාගි වූහ. මධ්‍යම ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ජීජේඑල් වඩුගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී වීඑස්වී එන්ඩියූ ගේ උපදෙස් හා මඟපෙන්වීම මත 11 වන සේනාංකයේ සේනාංකාධිපති ගේ පූර්ණ අධීක්ෂණය යටතේ මෙම කටයුත්ත සිදුකෙරිණි.


## ඩෙංගු මර්දන වැඩසටහනක්



දියතලාව මහ රෝහල හා දියතලාව ආයුර්වේද රෝහල මෙන්ම දියතලාව යුද්ධ හමුදා රෝහල ආවරණය වන පරිදි පැවැත්වූ ඩෙංගු මර්දන වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර් මස 25 දින දවස පුරා පැවැත්විණි. මධ්‍යම ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ජීජේඑල් වඩුගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී වීඑස්වී එන්ඩියූ ගේ උපදෙස් හා මඟපෙන්වීම මත එම ආරක්ෂක සේනා මූලස්ථානය යටතේ පාලනය වන පුහුණු පාසල් හා ඒකකයන් හි රාජකාරී කරනු ලබන නිලධාරීන් හා සෙබළු 60 දෙනෙකු මේ සඳහා එක්වූහ. පවතින වැසි සහිත කාලගුණික තත්වය හේතුවෙන් හිස ඔසවන ඩෙංගු වසංගතය මැඩපැවැත්වීම මෙම මාහැඟි කටයුත්තෙහි අරමුණ විය.







# ජාතික ආරක්ෂාව, ත්‍රස්තවාදය හා මානව හිමිකම්

යහපත් සමාජ ජීවිතයක් ගෙනයාම හා පුද්ගලයකු හට අවශ්‍ය සමාජ ඉඩප්‍රස්ථාවන් අයිතිවාසිකම් වශයෙන් සරලව විග්‍රහ කළ හැකිය. 1948 දෙසැම්බර් මස 10 දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ සම්මත කරන ලද එක්සත් ජාතීන්ගේ විශ්ව ප්‍රකාශනය පුද්ගල අයිතිවාසිකම් පිළිබඳ මුරගල වශයෙන් සැලකිය හැකි අතර, මෙම අන්තර්ජාතික නීතිමය මගපෙන්වීම අනුගමනය කරමින් ලෝකයේ රාජ්‍යය තම රටේ පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම උදෙසා නීති සකස් කර ඇත. නිදර්ශනයක් ලෙස අප රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 සිට 17 දක්වාවූ වගන්ති මගින් ශ්‍රී ලාංකේය පුරවැසියන්හට උරුමවන මූලික අයිතිවාසිකම් පිළිබඳව විග්‍රහකර ඇත.

හෘදසාක්ෂියේ හා ආගමික නිදහස, සර්ව සාධාරණත්වයේ අයිතිය, නිදහසේ ඔබමොබ යාමේ නිදහස, වෙනස්කොට සැලකීමට භාජනය නොවීමේ අයිතිය, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය, අත්තනෝමතිකව අත්අඩංගුවට ගැනීමෙන් වැළකීමේ අයිතිය හා තොරතුරු දැනගැනීමේ අයිතිය වැනි අයිතිවාසිකම් විශේෂයෙන් සඳහන් කළ හැකිය.

**"Your right to swing your arms ends just where the other man's nose begins"**

**"ඔබේ දෙඅත් රිසිසේ ඔබමොබ චලනය කිරීමේ ඔබට ඇති අයිතිය ඔබ සමීපයේ සිටින අනෙක් පුද්ගලයාගේ නහසය අසලින් කෙළවර විය යුතුය"**

මානවහිමිකම් පිළිබඳව හා පුද්ගල නිදහස ඉහත කී ප්‍රකාශයෙන් අපූරුවට පැහැදිලි කරයි. එනම් සෑම අයිතිවාසිකමක් පිටුපසම පුද්ගලයෙකු හා බැඳී පවතින යුතුකමක් ඇති අතර, පුද්ගල නිදහස භුක්තිවිඳිය යුතු වන්නේ අන්‍යයන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය නොවන පරිදි වේ. එනම් පොදුජන යහපත උදෙසා පුද්ගල අයිතිවාසිකම් යම්යම් අවස්ථාවන්හිදී සීමාවන්ට ලක්විය හැකි බව නීතියෙන් පවා පිළිගනී. අප රටේ වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 වන වගන්තිය මගින් පුද්ගලයකුගේ මූලික අයිතිවාසිකම් සීමාවන්ට ලක්විය හැකි අවස්ථාවන් විග්‍රහකර ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 වන වගන්තිය ප්‍රකාරව ඇතැම් මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේ ,

- ➢ රාජ්‍ය ආරක්ෂාව තහවුරු කිරීම පිණිස නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමාකිරීම් වලට යටත්වය.
- ➢ වාර්ගික හා ආගමික සහයෝගීතාවයට බාධාවක් නොවන පරිදි වේ.
- ➢ අධිකරණයට අපහාසයක් සිදුනොවන පරිදි වේ.
- ➢ ජාතික ආර්ථිකයට හා ජාතික ආරක්ෂාවට තර්ජනයක් නොවන පරිදි වේ.

අයිතිවාසිකම් භුක්ති විඳිය හැකිවන්නේ ඔවුන් තුළින් සමාජයට ඉටුවිය යුතු යුතුකම් ඉටුකරන අන්‍යයන්ගේ අයිතීන් ආරක්ෂා කිරීමට සත්භාවයෙන්ම කටයුතු කරන පුද්ගලයන්හට මිස සමාජය අනතුරේ හෙළන සමාජයට තර්ජනයක් වන පුද්ගලයන් හට නොවන බව මූලිකවම වටහා ගත යුතුවේ. මෙම අයිතිවාසිකම්, යුතුකම් හා ඒවායේ සීමාවන් පිළිබඳ නෛතික තත්වය එක්සත් ජාතීන්ගේ විශ්ව ප්‍රකාශනයේ 29 වන වගන්තිය මගින්ද විග්‍රහකර ඇත.

ත්‍රස්තවාදය යන්න පිළිබඳ ජාත්‍යන්තරව පොදුවේ පිළිගත් නිර්වචනයක් නොමැති අතර විවිධ ජාතීන් විසින් විවිධාකාරයෙන් එය අර්ථ නිරූපණය කර ඇතිබවද නිරීක්ෂණය වේ.

ශ්‍රී ලංකාවේ නීතිය අනුව සැලකීමේදී 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මගින් හෝ මහජන ආරක්ෂක ආඥා පනත මගින් හෝ ත්‍රස්තවාදය යන්න අර්ථ නිරූපණයට ලක්කර නොමැත. මෙම නීතිමය හිදැස පිළිසකර කරගැනීම සඳහා අංක 1474/5 - 2006 දෙසැම්බර් 06 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ 20 වන වගන්තිය මගින් පුළුල් අර්ථ නිරූපණයක් සිදුකර ඇති බව දක්නට ලැබේ.

එම අර්ථ නිරූපණය අනුව නිතැතින්ම පෙනෙන කරුණක් වන්නේ ත්‍රස්තවාදය පවතින පසුබිමක් තුළ පුද්ගලයන්ගේ මූලික අයිතිවාසිකම් නිරායාසයෙන්ම ඔවුන් හට අහිමිවී ඇති බවයි. තිස් වසරකට අධික කාලපරාසයක් **LTTE** ත්‍රස්තවාදයෙන් බැටකෑ ජාතියක් ලෙසත් මෑත කාලීනව අන්තවාදී ත්‍රස්තයින්ගේ කුරිරු ත්‍රස්ත ක්‍රියා ඇසින් දුටු ජාතියක් වශයෙනුත් ත්‍රස්ත ක්‍රියා හමුවේ මානව හිමිකම් උල්ලංඝනය වූ අයුරු තහවුරු කිරීමට අපමණ සාක්ෂි ලැයිස්තුගත කළ හැකිය.

වරෙක **LTTE** ත්‍රස්තවාදීන් මාරාන්තික ප්‍රහාර එල්ල කරනු

ලැබුවේ බෞද්ධයන්ගේ මුදුන් මල්කඩක් බඳුවූ ශ්‍රී මහාබෝධිය හා දළදා මාලිගාවටයි. මෑතකාලීනව අන්තවාදීන් ප්‍රහාර එල්ල කරනු ලැබුවේ පාස්කු ඉරිදා පල්ලියේ ආගම අදහනු අහිංසක කතෝලික ජනතාව ඉලක්ක කරගෙනයි. තවත් අවස්ථාවකදී අරන්තලාවේ භික්ෂූන් වහන්සේලා ම්ලේච්ඡ ලෙස ඝාතනය කරනු ලැබුවේද LTTE ත්‍රස්තවාදීන් විසිනි. අකුරැස්ස ගොඩපිටිය මුස්ලිම් පල්ලියේ පැවති උත්සවයකදී LTTE ත්‍රස්තවාදීන් මරාගෙන මැරෙන ප්‍රහාරයක් එල්ල කරනු ලැබුවේ ඉස්ලාම් භක්තිකයින් ඉලක්ක කරගෙනයි. එනම් යම් පුද්ගලයෙකුට නිදහසේ ආගමක් ඇදහීමට ඇති අයිතිය මෙහිදී ඉදුරාම ත්‍රස්තවාදය විසින් උල්ලංඝනය කර ඇත. පුද්ගලයෙකු හට තම ආගම ඇදහීමේ අයිතිය වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වන ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති පරම අයිතියක් වශයෙන්ද සලකයි.

> **"මාවිල්ආරු අමුණ වසා දමමින් ත්‍රස්තවාදීන් ක්‍රියාකළේ සිවිල් පුරවැසියන්ගේ අයිතීන් උල්ලංඝනය කිරීම මිස රජයේ හමුදාවන්ට හානි පැමිණවීමට නොවේ. එහිදී පුවැසියන් හට සොබාදහමේ උරුමයක් වූ නිදහසේ ජලය භාවිතා කිරීමට, පිපාසයට සත්වයන්ට පවා ජල බිඳක් ලැබීමේ අයිතිය, බාධාවන්ගෙන් තොරව කෘෂිකර්මාන්තය හා අනිකුත් වෘත්තීන්හි නියැළීමට ඇති අයිතියද උල්ලංඝණය වූ බව සඳහන් කළ යුතු වේ."**

එක්තරා කාලපරිච්ඡේදයක LTTE ත්‍රස්තවාදීන් සෘජුව සිය ඉලක්කයක් සපුරාලීම සඳහා දුම්රිය බස්රථ තුළ හා සාමාන්‍ය ජනතාව සඳහා වෙන්වූ සිවිල් ස්ථානයන්හිදී බෝම්බ පුපුරුවා හරිමින් සමස්ත සිවිල් වැසියන්ගේ ජීවත්වීමේ අයිතිය **(Right to live)** පවා අහිමි කිරීමට ක්‍රියාකළ ආකාරය ශ්‍රී ලාංකිකයන් හට අමතක නොවනු ඇත. අනුකම්පා විරහිත ත්‍රස්තවාදීන්ගේ මෙවැනි ප්‍රහාර හරහා කුඩා දරුවන්ගේ සිට වයෝවෘද්ධ වැඩිහිටියා දක්වා වූ පුද්ගල ජීවිතවලට අකාලයේ නැවතීමේ ලකුණ තැබීමට සිදුවූ බව නොරහසකි.

තවද පොදු මහා මාර්ග අවහිර කරදැමීම හා දුම්රිය මාර්ග විනාශ කරදැමීම පමණක් නොව ජනතා සුබසාධනය උදෙසා ගොඩනැගූ ජලටැංකි පුපුරවා බිම හෙළීමට පවා ත්‍රස්තවාදීන් කුපිරුවූ බව පෙනේ. මෙවැනි ක්‍රියා මානව හිමිකම් නීතිය **(Human Rights Law)** යටතේ පමණක් නොව ජාත්‍යන්තර මානුෂවාදී නීතිය **(International Humanitarian Law)** යටතේ පවා ඉදුරාම නීතිවිරෝධී බව සක්සුදක්සේ පැහැදිලිය.

**LTTE** ත්‍රස්තවාදීන් තම මතයට එකඟ නොවූ අහිංසක දමිළ වැසියන් පවා ඝාතනය කිරීමට පසුබට නොවූ බවටද අතීතය සාක්ෂි දරයි. ලක්ෂ්මන් කදිරගාමර් මහතා වැනි බුද්ධිමතුන් පමණක් නොව මැතිවරණයකදී ඡන්දය භාවිත කළ සිවිල් වැසියන් ඝාතනය කිරීමටත් අත්පා කපා ම්ලේච්ඡ දඬුවම් පැමිණවීමටත් කටයුතු කළ අතර ස්වෝත්සාහයෙන් නැගීසිටි දෙමළ ව්‍යාපාරිකයින්ගෙන් කප්පම් මුදල් එකතු කරමින් ඔවුන් පීඩාවට පත්කිරීමටත් කෲර හා අමානුෂික දඬුවම් හා වදහිංසා පැනවීමටත් නීත්‍යානුකූල නොවූ **LTTE** පොලිසි, රැඳවුම් කඳවුරු හා අධිකරණ මගින් කටයුතු කළ බවත් ඒවා ව්‍යවස්ථානුකූල ආයතන නොවන බවත් නීතියේ ආධිපත්‍යයට **(Rule of Law )** පවා බරපතල තර්ජනයක් වූ බවද සඳහන් කළයුතු වේ.

මාවිල්ආරු අමුණ වසා දමමින් ත්‍රස්තවාදීන් ක්‍රියාකළේ සිවිල් පුරවැසියන්ගේ අයිතීන් උල්ලංඝණය කිරීම මිස රජයේ හමුදාවන්ට හානි පැමිණවීම නොවේ. එහිදී පුරවැසියන් හට සොබාදහමේ උරුමයක් වූ නිදහසේ ජලය භාවිතා කිරීමේ අයිතියද, සත්වයන්ට පිපාසයට ජල බිඳක් ලැබීමේ අයිතියද, බාධාවන්ගෙන් තොරව කෘෂිකර්මාන්තය හා අනිකුත් වෘත්තීන්හි නියැළීමට ඇති අයිතියද උල්ලංඝණය වූ බව සඳහන් කළ යුතු වේ.

ත්‍රස්තවාදය පැවති ඒ අඳුරු අතීතය තුළ ශ්‍රී ලාංකීය පුරවැසියන්ට දිවයිනේ උතුරු නැගෙනහිර ඇතැම් ප්‍රදේශ වෙත ගමන් කිරීම පවා සිහිනයක් වූ බව සඳහන් කළ යුතු වේ. ඒ තුළ පුද්ගලයෙකුට තමා කැමති ස්ථානයක පදිංචිවීම හා බියෙන් සැකෙන් හා පීඩනයෙන් තොරව ඔබ මොබ යාමේ අයිතිවාසිකම්ද **(Freedom of movement)** උල්ලංඝණය වූ බව පෙනේ.

රටේ පවතින නීතියට පටහැනිව ළමා අයිතිවාසිකම් **(Child's right)** උල්ලංඝණය කරමින්, කුඩා දරුවන් ළමා සොල්දාදුවන් ලෙස බඳවා ගනිමින්, ඔවුන් යුද්ධය කටයුතු සඳහා පුහුණු කරවමින්, ඔවුන්ගේ සොඳුරු ළමාවිය උදුරා ගැනීමට පවා ත්‍රස්තවාදීන් කටයුතු කළ බව සිහිකරනු කැමැත්තෙමි. ඒ තුළ අහිංසක දරුවන්ගේ අධ්‍යාපන අයිතියම **(Right to Education)** අහිමි විය.

ත්‍රස්තවාදය පවතින ස්ථානයක පුද්ගල අයිතිවාසිකම් යනු සුරංගනා කතාන්දරයක් පමණක් බව සක්සුදක් සේ පැහැදිලිය. මූලිකවම ත්‍රස්තවාදීන් පුද්ගලයින්ගේ ජීවත්වීමේ අයිතිය උල්ලංඝණය කරන බැවින් ජීවත්වීමේ අයිතිය තහවුරු නොවන වටපිටාවක් තුළ අනිකුත් අයිතිවාසිකම් ගැන කතා කිරීම පවා හාස්‍ය උපදවන කරුණක් වේ. පිපාසයෙන් දැවෙන පුද්ගලයෙකු හට මූලිකවම හිමිකර දිය යුත්තේ දිය පොදක් මිස පැළඳීම සඳහා මල් මාලයක් නොවේ. ජීවත්වීම පිළිබඳ බියෙන් සැකෙන් හා පීඩනයන්ගෙන් පසුවන සමාජයක මූලිකවම තහවුරු කළ යුත්තේ ජීවත්වීමේ අයිතිය මිස නිදහසේ ඔබමොබ යාමේ අයිතිය නොවේ. ජීවත්වීමේ අයිතිය තහවුරු කරන තෙක් නිදහසේ ඔබමොබ යාමේ අයිතිය යම්තාක් දුරකට සීමා වියහැකි අතර, එය ජාතික ආරක්ෂාවේ අවශ්‍යතාව වෙනුවෙන් හා පොදුජන යහපත උදෙසා දරාගැනීමට මුළු මහත් සමාජයම වගබලා ගතයුතු වේ.

ඒ අනුව ත්‍රස්තවාදීන්ට එරෙහිව ක්‍රියාත්මක වීම සඳහා පොලීසිය හා ත්‍රිවිධ හමුදාවන්ට බලය දෙමින් ශක්තිමත් නීති පැනවීම අතිශය වැදගත් වේ. මහජන ආරක්ෂක පනත හා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මගින් මෙහිදී ත්‍රස්තවාදීන්ට එරෙහිව ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය විශේෂ බලතල බලධාරීන් වෙත ලබාදී ඇත.

නිදර්ශනයක් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 37 වගන්තිය ප්‍රකාරව යම් අපරාධ වරදක් සම්බන්ධයෙන් සැකපිට අත්අඩංගුවට ගනු ලැබූ පුද්ගලයෙකු පැය 24 ක් ඇතුළත මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් කිරීමට පොලිස් නිලධාරීන් නීතියෙන් බැඳී ඇතත්, ත්‍රස්තවාදී ක්‍රියා සම්බන්ධයෙන් සැකපිට අත්අඩංගුවට ගන්නා පුද්ගලයෙකු සහකාර පොලිස් අධිකාරිවරයකුගේ අනුමැතිය යටතේ පැය 72 ක් රඳවා ගනිමින් විමර්ශන කටයුතු සිදුකර ඉන් අනතුරුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 6 සහ 7 වගන්තිය ප්‍රකාරව පොලීසිය වෙත බලය ලබාදී ඇත. ඇතැම් අවස්ථාවන්වලදී සිවිල් පොලිස් නිලධාරීන් හට පවා ත්‍රස්තයින් විසින් බලය තහවුරු කරගත් ප්‍රදේශවල ප්‍රබල ත්‍රස්ත ක්‍රියා හේතුකොටගෙන විමර්ශන කටයුතු සිදු කිරීමට නොහැකි තත්වයක් උද්ගත විය හැකිය. **LTTE** ත්‍රස්තවාදය පැවති යුගයේ ඇතැම් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල පොලිස් රාජකාරි සිදුකිරීමට නොහැකිවීම මීට කදිම නිදසුනකි. එවැනි අවස්ථාවලදී ත්‍රස්තයින්

අත්අඩංගුවට ගෙන පොලීසිය වෙත භාර කිරීමේ බලය හා ඒ සඳහා ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීමේ නෛතික බලයද ත්‍රිවිධ හමුදාවන්ට පැවතිය යුතුවේ. එය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත තුළින් තහවුරු කර ඇත.

තවද, 1997 අංක 30 දරන ඇප පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගනු ලබන සැකකරුවන් සම්බන්ධයෙන් ඇප පනතේ විධි විධාන බලාත්මක නොවන බව ඇප පනත මගින්ම ප්‍රකාශිතව ඇත. එනම් නීති සම්පාදකයින් පවා ත්‍රස්තවාදයට එරෙහිව ක්‍රියාත්මක වීම සඳහා ශක්තිමත් පදනමක් ලබා දී ඇති බව පෙනේ. එනම් නීති මගින් නිලධාරීන් හට මෙවැනි විශේෂ බලයක් හිමිගන්වා ඇත්තේ ත්‍රස්තවාදය යනු ඉතා බරපතල ව්‍යසනයක් බැවිනි. ඒ නිසා ඊට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම කළ යුත්තේ සාමාන්‍ය අපරාධ වරදක චූදිතයෙකු සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරනවාට වඩා බරපතල කර්තව්‍යයක් බව නීති විශාරදයින් පවා අවබෝධ කරගෙන ඇති බැවිනි.

ත්‍රස්තවාදීන් යනු සාමාන්‍ය පුරවැසියන් මෙන් සරලව අපරාධ කරන පිරිසක් නොවන අතර, නූතන තාක්ෂණය උපයෝගී කරගනිමින් මනා ලෙස සැලසුම් කරමින් ආරක්ෂිත ක්‍රම භාවිතා කරමින්, කරුණු වසන් කරමින්, ඉතා බිහිසුණු මනුෂ්‍යත්වයට එරෙහි කුරිරු හා ම්ලේච්ඡ අපරාධ සිදුකිරීමට සංවිධානාත්මකව කටයුතු කරන පිරිසක් වේ. ඇමෙරිකානු ආරක්ෂක මධ්‍යස්ථානය වූ පෙන්ටගනයට එල්ලකළ ඔසාමා බින්ලාඩන්ගේ සැලසුම් සහගත ප්‍රහාරය හා **ISIS** ත්‍රස්තයින්ගේ සැලසුම් සහගත ක්‍රියා කලාපයන් මීට කදිම නිදසුන් වේ. එය ගමක සිදුවූ සරල සොරකමක් විමර්ශනය කර අධිකරණය වෙත කරුණු වාර්තා කරනවා මෙන් පහසු කටයුත්තක් නොවන බව පොලිස් නිලධාරීන් හා ආරක්ෂක නිලධාරීන් ඉතා හොඳින් දන්නා කරුණකි.

> **"ත්‍රස්තවාදීන් යනු සාමාන්‍ය පුරවැසියන් මෙන් සරලව අපරාධ කරන පිරිසක් නොවන අතර, නූතන තාක්ෂණය උපයෝගී කරගනිමින් මනා ලෙස සැලසුම් කරමින් ආරක්ෂිත ක්‍රම භාවිතා කරමින්, කරුණු වසන් කරමින්, ඉතා බිහිසුණු මනුෂ්‍යත්වයට එරෙහි කුරිරු හා ම්ලේච්ඡ අපරාධ සිදුකිරීමට සංවිධානාත්මකව කටයුතු කරන පිරිසක් වේ."**

එනම් ත්‍රස්තවාදයට එරෙහිව කටයුතු කිරීම සඳහා විශේෂ නීතියක් පැවතිය යුතු බව ඉතා පැහැදිලි කරුණක් වන අතර, දැනට පවතින ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මගින් මෙකී කාරණය සඳහා අවශ්‍ය ශක්තිමත් නෛතිකමය පදනමක් සපයයි. එහෙත් මීට අමතරව අන්තර්ජාලය හරහා සයිබර් අවකාශය තුළ සිදුකළ හැකි ත්‍රස්ත ක්‍රියා මැඩලීම සඳහා අවශ්‍ය නෛතික ප්‍රතිපාදන සැකසීම ත්‍රස්තවාදය මැඩලීම සඳහා අන්තර්ජාතික සහයෝගය ලබාගැනීමට, තාක්ෂණික සහය ලබාගැනීමට අවශ්‍ය නෛතික ප්‍රතිපාදන සකසා වර්තමාන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත තවදුරටත් ශක්තිමත් කිරීම සිදුකළ යුතු බව පෙනේ.

එහෙත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ශක්තිමත් කිරීම වෙනුවට එය සම්පූර්ණයෙන්ම අහෝසි කර ප්‍රතිත්‍රස්ත පනත නමින් නව පනතක් ගෙනඒමට කතිකාවතක් නිර්මාණය වෙමින් පවතී. එහෙත් මෙම යෝජිත පනත පවතින ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත තරම් ශක්තිමත් පනතක් නොවන බවත් ඒ තුළින් ත්‍රස්තවාදයට එරෙහිව නෛතිකමය ක්‍රියාමාර්ග ගැනීමේදී ආරක්ෂක අංශ හා පොලීසිය යම් අපහසුතාවයන්ට ලක්විය හැකි බව දක්නට ලැබේ. නිදර්ශනයක් ලෙස ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අනුව සැකකරුවෙකු පැය 72 ක කාලයක් රඳවා ප්‍රශ්න කරමින් විමර්ශන සිදුකර මහේස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉදිරිපත් කිරීමට පොලීසියට බලය පවතින නමුත්, යෝජිත නව පනත මගින් එය පැය 48 ක කාලසීමාවක් දක්වා සීමාකර ඇත. තවද නව ප්‍රතිත්‍රස්ත පනත ඇප පනත මගින් ප්‍රකාශිතව බැහැරකර නොමැති බැවින්, ඇප පනතේ ප්‍රතිපාදන යෝජිත ප්‍රතිත්‍රස්ත පනත සම්බන්ධයෙන් බලපැවැත්වෙන බැවින් ත්‍රස්තවාදී සැකකරුවන්ට පවා ඇප ලබාගැනීම අයිතියක් වශයෙන් සැලකිය හැකි වේ. එහිදී එවැනි සැකකරුවන්ට පවා ඇප ලබා දීම නීතියක් වශයෙන් සලකා කටයුතු කිරීමට අධිකරණ විනිසුරුවන් හට සිදුවන අතර, එය ත්‍රස්ත ක්‍රියා විමර්ශනය කරන පොලිස් හා ආරක්ෂක



නිලධාරීන් හට බාධාවක් විය හැකිය.

මේ අනුව සමස්තයක් ලෙස ගත්විට, ත්‍රස්තවාදීන්ට එරෙහිව කටයුතු කිරීම යනු මානවයාගේ ජීවත්වීමේ අයිතිය තහවුරු කිරීම සම්බන්ධ උත්තුංග ක්‍රියා පටිපාටියක් බැවින් ඒ පිළිබඳව ශක්තිමත් නීති පැවතීමෙන් නිලධාරීන්ට ඵලදායි ලෙස විමර්ශනයක් කිරීමටත්, අපරාධකරුවන් නීතියේ රැහැනට හසුකර ගැනීමට ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමටත් අවශ්‍ය නෛතික වටපිටාව ශක්තිමත් කිරීමටත් ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සම්බන්ධයෙන් අතිශය වැදගත් වේ. මේ අනුව යෝජිත ප්‍රතිත්‍රස්ත පනත වෙනුවට පවතින ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත නව සංශෝධන මගින් වඩාත් ශක්තිමත් කිරීම යුගයේ අවශ්‍යතාවක් වී ඇත.

*මේජර් සදුන් ගුණවර්ධන*
***LLB.(Colombo), LL.M(KDU) & Attorney at Law***
*නීති නිලධාරී, ආරක්ෂක අමාත්‍යංශය*

# ඉටුකළ සේවය අගයමින්



යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනී සුජීවා නෙල්සන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් සේවා වනිතා ඒකකයේ හිටපු සභාපතිනිය චන්ද්‍රිකා සේනානායක මහත්මිය හට සේවා වනිතා ඒකකය වෙත ලබාදුන් ක්‍රියාකාරී දායකත්වය හා කැපවීම අගයා සමුගැනීමේ සාදයක් හා රාත්‍රී භෝජන සංග්‍රහයක් ඉකුත් සැප්තැම්බර් මස 22 දින පස්වරුවේ හිල්ටන් හෝටලයේ බෝල්රූම් ශාලාවේදී පැවැත්විණි.

යුද්ධ හමුදා අධිරිද්ම සංගීත කණ්ඩායමේ සංගීතයෙන් හා නර්තනයෙන් අලංකාරවත් වූ එම අවස්ථාවට සේවා වනිතා ඒකකයේ විධායක කමිටු සාමාජිකාවන් හා සේවා වනිතා ශාඛාවන්හි සභාපතිනියන් ඇතුලු සාමාජිකාවෝ පිරිසක් සහභාගී වූහ. මෙහිදී චන්ද්‍රිකා සේනානායක මහත්මිය වෙත සමරු තිළිණයක් හා එතුමියගේ සේවා කාලය තුළදී සිදුකරන ලද ක්‍රියාකාරකම් ඇතුළත් ඡායාරූප ඇල්බමයක්ද සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනිය අතින් ප්‍රදානය කෙරිණි.





ශ්‍රී ලංකා පාබල හමුදා
රෙජිමේන්තුවට අයත්
**මේජර් ඒඩීඑම් අත්තනායක පීඑස්සී**
හා
1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා
කාන්තා බළකායේ රාජකාරී නියුතු
**කපිතාන් ඩීඑම්එම්එම් තිලකරත්න**
2019 අගෝස්තු මස 28 දිනට යෙදී තිබූ
සුබ මොහොතින් යුගදිවි ගමන්
අරඹන ලදී.



16 වන ශ්‍රී ලංකා
සිංහ රෙජිමේන්තුවට අයත්
**රසෙ කුමාර එච්ඩීආර්ඩී**
හා
**ඩබ්ලිව්පී දිල්හානි වීරසේකර**
2019 ජූලි මස 18 දිනට යෙදී තිබූ
සුබ මොහොතින් යුගදිවි ගමන්
අරඹන ලදී.



8 වන විජයබාහු
පාබල රෙජිමේන්තුවට අයත්
**කපිතාන් කේඩීඩීඑම් කංකානිගේ**
හා
7 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා
බළකායට අයත්
**කපිතාන් එච්ඩබ්ලිව් ලක්මිකා**
2019 සැප්තැම්බර් මස 05 දිනට යෙදී
තිබූ සුබ මොහොතින් යුගදිවි ගමන්
අරඹන ලදී.







# සටන් බිම විකුම් පෑ විරුවන්ව බැහැදැක...

සටන් බිමෙහි තුවාල ලැබ දැනට රාගම රණවිරු සෙවණේ නේවාසිකව ප්‍රතිකාර ලබන විරෝදාර රණවිරුවන්ගේ සුවදුක් සොයා බැලීම සඳහා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් සැප්තැම්බර් මස 04 වන දින එහි සංචාරයක නිරතවිය.

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනී සුජීවා නෙල්සන් මහත්මියද එම අවස්ථාවට සහභාගී වූවාය. එහිදී යුද්ධ හමුදාධිපති එහි නේවාසිකව ප්‍රතිකාර ලබන සෑම රණවිරුවෙකු සමඟම සුහදව අදහස් හුවමාරු කරගනිමින් ඔවුන්ගේ අවශ්‍යතා පිළිබඳව පුද්ගලිකවම සොයා බැලීය. යුද්ධ හමුදාධිපති එවකට අවසන් මානුෂීය මෙහෙයුමට අණදෙන සමයේ යුදබිමේදී ලද අත්දැකීම් පිළිබඳව එහි සෙබලුන් සමඟ සිය මතකයන් ආවර්ජනය කරන්නටද අමතක නොකළේය. මෙම සංචාරය අතරතුර යුද්ධ හමුදාධිපති තුමා හා සේවා වනිතා සභාපතිනිය විසින් එකී නේවාසික රණවිරුවන් උදෙසා ත්‍යාග පාර්සල් පිරිනැමීමටද කටයුතු කරන ලදී.

# අභිමන් ගමනකට නව ජවයක්









යුදබිමේ විශිෂ්ට දක්ෂතා දක්වූ විශේෂ බලකායේ නව රෙජිමේන්තු අධිපති ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් සැප්තැම්බර් 07 දින එම රෙජිමේන්තු මූලස්ථානයේදී වැඩ භාරගන්නා ලදී. එහිදී විශේෂ බලකා භට පිරිස් විසින් යුද්ධ හමුදාධිපති වෙත කඳවුරු සම්මාන මුරයක් මෙන්ම වර්ණවත් සම්මාන ආචාර පෙළපාලියක් ද පිරිනමමින් බුහුමන් පුදකළහ. අනතුරුව භටපිරිස් ඇමතූ නව රෙජිමේන්තු අධිපති සියලු නිල තේ පැන් සංග්‍රහයකටද එක්විය. ජවබල පිරි විශේෂ බලකායට නව නායකත්වය යටතේ විශිෂ්ට මෙහෙවරක යෙදෙන්නට හැකිවනු නොඅනුමානය.



# ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංඥා බළකා සේවා වනිතා ශාඛාව





ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ වාර්ෂික මහසභා රැස්වීම ඉකුත් සැප්තැම්බර් මස 08 දින ගරු සභාපතිනිය කේෂිනි හෙට්ටිආරච්චි මහත්මියගේ ප්‍රධානත්වයෙන් එම බළකා නිලධාරී නිවස්නයේදී පැවැත්විණ. එදින සංඥා බළකා සාමාජිකයින්ගේ මෙන්ම ඊට අයත් සිවිල් සේවකයින්ගේ දූ දරුවන් වෙත පොත්පත් බෙදාදීමේ වැඩසටහනක්ද ක්‍රියාත්මක කෙරිණ. ලෝක ළමා දිනය හා සාහිත්‍ය දිනයට සමගාමීව සංවිධානය වූ එම වැඩසටහන සඳහා එහි බළකාධිපති මේජර් ජෙනරාල් එන්එම් හෙට්ටිආරච්චි වීඑස්වී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී සහ හිටපු සේවා වනිතා සභාපතිණියන්ද සහභාගී වූහ.





# සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව

සිංහ රෙජිමේන්තුවට අයත් නිලධාරීන් හා සෙසුනිලයන්ගේ දූවාදරුවන් 70 දෙනෙකු සඳහා වූ අධ්‍යාපනික හා නායකත්ව නේවාසික වැඩමුළුවක් ඉකුත් අගෝස්තු 27 දින සිට 31 දින දක්වා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනී ගිරෝමි මාසකෝරාල මහත්මියගේ සංකල්පයකට අනුව සිංහ රෙජිමේන්තු අධිපති ගේ අධීක්‍ෂණයෙන් සිදුකෙරුණු එම වැඩමුළුව ප්‍රවීණ මනෝවිද්‍යා පුහුණු උපදේශක චන්දන ගුණවර්ධන මහතා විසින් මෙහෙයවන ලදී. මෙම වැඩසටහනේ සමාප්ති උළෙල සඳහා යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන මෙන්ම සිංහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එම්කේඩී පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ මෙන්ම සිංහ රෙජිමේන්තු නිලධාරීන්, සෙබලුන් සහ වැඩසටහන සඳහා සහභාගී වූ දූදරුවන්ගේ දෙමාපියන් විශාල පිරිසක් ද සහභාගී වූහ.







# ගැමුණු හේවා බළකා සේවා වනිතා ශාඛාව

17 ගැමුණු හේවා බළකායට අයත්ව රාජකාරී කරමින් සිටියදී රණකාමිතයට පත් ලාන්ස් කෝප්‍රල් අබේවර්ධන බීඑල්එන්එස්කේ රෝගී තත්ත්වයක් හේතුවෙන් පසුගියදා මියයන ලදී. අනතුරුව ඔහුගේ බිරිඳ විසින් තමන් හා දරුවන් හට ස්ථිර පදිංචියට නිවසක් නොමැතිව ඔවුන් පත්ව ඇති අපහසුතාව පිළිබඳව ගැමුණු හේවා බළකා සේවා වනිතා ශාඛාව දැනුවත් කොට ඇත. පසුව තත් කොනොනිගේ බිරිඳ දැනට කුලී පදනම මත පදිංචිව සිටි නිවස මිලදීගෙන ඇය වෙත පිරිනැමීමට ගැමුණු හේවා රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව මැදිහත් විය. ඒ අනුව රුපියල් ලක්‍ෂ දහයක මුදලක් වැයකොට මිලදීගත් එම නිවස 17 ගැණේබ ඒකකයෙහි ශ්‍රමදායකත්වය මත නවීකරණය කොට ඉකුත් අගෝස්තු මස 30 දින සේවා වනිතා ශාඛාවේ සභාපතිනී සුජීවා ජයසේකර මහත්මියගේ ප්‍රධානත්වයෙන් නිවැසියන් වෙත භාරදෙන ලදී.



## ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකාය

1881 අප්‍රේල් මස 01 දින ලංකා ස්වේච්ඡා පාබල හමුදාව නගා සිටුවන ලද අතර, එම අවදියේදී එහි අට දෙනෙකුගෙන් සමන්විත ගිලන් මැසි ආධාරක කණ්ඩායමක් වූහ. මෙම කණ්ඩායමේ සාමාජිකයින් සියලු දෙනා වෛද්‍ය ශිෂ්‍යයින් වූ අතර, 1881 ජූලි 29 දින මෙකී ගිලන් මැසි ආධාරක කණ්ඩායම, බ්‍රිතාන්‍ය රාජකීය වෛද්‍ය සේවයේ "ශල්‍ය වෛද්‍ය" යන නිල නාමය හිමි, විශ්‍රාමික වෛද්‍ය නිලධාරියෙකු වූ ඩීඑච්එෆ් පොට්හිල්ගේ විධානය යටතට පත්කර ස්වාධීන කණ්ඩායමක් බවට පත් කරන ලදී. ලංකා වෛද්‍ය බළකායේ ආරම්භය සනිටුහන් වන්නේ මෙදින සිටය. 1881 වසර අවසානය වන විට මෙම කණ්ඩායම වෛද්‍ය ශිෂ්‍යයින් 24 දෙනෙකුගෙන් සමන්විත වූ අතර, පසුව වෛද්‍ය ශිෂ්‍යයින් නොවන සෙසු අයද වෛද්‍ය ඒකක සාමාජිකයින් ලෙස බඳවා ගන්නා ලදී. මෙම ආධාරක හට කණ්ඩායමේ පුහුණුව ඔවුන් මුලින් අයත්ව සිටි පාබල හමුදාවේ පුහුණුව හා සමාන්තරව සිදුකළ අතර, ඊට අමතරව ගිලන් මැසි සරඹ පුහුණුව, ප්‍රථමාධාර විධි සහ ක්ෂේත්‍ර වෛද්‍ය රාජකාරි පිළිබඳ උපදෙස් හා පුහුණුව වෛද්‍ය විද්‍යාල භූමියේදී ලබාදෙන ලදී.

වසර 1911 දී ලංකා පාබල හමුදාවේ ආධාරක හට කණ්ඩායමක් වශයෙන් වූ සම්බන්ධකම් අතහැර ලංකා ස්වේච්ඡා වෛද්‍ය බළකාය නමින් ස්වාධීන ඒකකයක් බවට පත්වූ මෙම ඒකකය නිලධාරීන් දස දෙනෙකුගෙන් (10) සහ සෙසු නිල දරන්නන් එකසිය දෙදෙනෙකුගෙන් (102) සමන්විත විය.

**"ශ්‍රී ලංකාව තුළ යුද්ධ හමුදා රෝහල් හි ඓතිහාසික විකාශය අනුව 1950 වර්ෂයේදී රෝගීන් භාරගන්නා ස්ථානයක් ලෙස ඇඳන් 10 කින් ආරම්භ කරන ලද කොළඹ යුද්ධ හමුදා රෝහල මේ වන විට ඇඳන් 1000 කින් සමන්විතව සියලු වෛද්‍ය පහසුකම් සැපයිය හැකි අංග සම්පූර්ණ යුද්ධ හමුදා රෝහලක් ලෙස වැඩිදියුණුවී ඇත."**

1949 ඔක්තෝබර් මස 10 දින පැවති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අංක 17 දරන හමුදා පනත අනුමත කර ගන්නා ලද අතර, එම පනතට අනුව එතෙක් පැවැති ලංකා ආරක්ෂක බලසේනාව **(Ceylon Defence Force)** ලංකා යුද්ධ හමුදාව **(Ceylon Army)** බවට පරිවර්තනය විය. ඒ අනුව ප්‍රථම වතාවට ස්වේච්ඡා ඒකක පාදක කර ගනිමින් ස්ථිර හමුදාවක් ස්ථාපිතකර, ඒ වන විට ලංකා වෛද්‍ය ඒකකය ලෙස පැවැති ස්වාධීන වෛද්‍ය ඒකකය, 1949 ඔක්තෝබර් 21 දින සිට "ලංකා යුද හමුදා වෛද්‍ය බලකාය" **(Ceylon Army Medical Corps)** ලෙස නම් විය.

1972 නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කිරීමෙන් ලංකා යුද්ධ හමුදාව **(Ceylon Army)** ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ලෙස ප්‍රතිනාමකරණය වීමෙන් පසු 1972 මැයි 22 දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය **(Sri Lanka Army Medical Corps)** ලෙස නම් කරන ලදී.

# රෙජිමේන්තු ඉතිහාසය



**බලකාධිපති**
**මේජර් ජෙනරාල්**
**එස්එච් මුණසිංහ ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී ඩබ්ලිව්එස්වී යූඑස්පී**

1881 ජූලි 29 දින ස්වේච්ඡා පාබල හමුදාවේ ගිලන් මැසි කණ්ඩායමක් ලෙස ආරම්භ වූ වෛද්‍ය බළකායෙහි ශීර්ෂ ලාංඡනයේ අලියා සහ පොල් ගසක් ද, වෘත්තාකාරව **"CEYLON VOLUNTEERS"** යනුවෙන්ද විය. 1911 ජූනි 13 ලංකා ස්වේච්ඡා වෛද්‍ය බලකාය වෙනම ඒකකයක් ලෙස නම් කිරීමෙන් අනතුරුව එහි සිරස්ක ලාංඡනය ලෙස මධ්‍යයෙහි රතු කුරුසය සහ දෙපස ඔලිව් අතු දෙකක්ද, මුදුනෙහි ලංකා පාබල හමුදාවේ ලාංඡනයේ සඳහන් වේල්ස් කුමරුගේ ලාංඡනයද, පාදමයෙහි **"CEYLON VOLUNTEER MEDICAL CORPS"** ලෙසද, 1918 අප්‍රේල් මස රාජකීය හමුදා වෛද්‍ය බලකායට සම්බන්ධ ඒකකයක් වශයෙන් පවතින විට පාදමයෙහි **"CEYLON MEDICAL CORPS"** ලෙසද සැකසිණ. පසුව දෙපස ඔලිව් අතු දෙකක්ද, මුදුනෙහි රාජකීය ඔටුන්නද, මධ්‍යයෙහි යෂ්ඨිය වටා එතුණු විෂ රහිත සර්පයෙකුගේ රූපයක් ද විය. මේ වන විට "ශ්‍රීලයුවෛබ" ලෙස පාදමයේ සටහන් කර, ශීර්ෂයෙහි ඔටුන්න වෙනුවට රාජ්‍ය ලාංඡනයේ අසිපත සහිත සිංහ සලකුණ යොදා, දෙපසට ඔලිව් අතු වෙනුවට සෞභාග්‍ය පිළිබිඹු වන වී කරල් දෙක මධ්‍යයෙහි යෂ්ඨිය වටා එතුණු විෂ රහිත සර්පයෙකුගේ රූපයකින් සමන්විතව සිරස්ක ලාංඡනය භාවිතා කරනු ලබයි.

ශ්‍රී ලංකාව තුළ යුද්ධ හමුදා රෝහල් හි ඓතිහාසික විකාශය අනුව 1950 වර්ෂයේදී රෝගීන් භාරගන්නා ස්ථානයක් ලෙස ඇඳන් 10 කින් ආරම්භ කරන ලද කොළඹ යුද්ධ හමුදා රෝහල මේ වන විට ඇඳන් 1000 කින් සමන්විතව සියලු වෛද්‍ය පහසුකම් සැපයිය හැකි අංග සම්පූර්ණ යුද්ධ හමුදා රෝහලක් ලෙස වැඩිදියුණුවී ඇත. එයට සමගාමීව 1950 වර්ෂයේදී ඇඳන් 10 කින් යුතුව රෝගීන් භාරගන්නා ස්ථානයක් ලෙස ස්ථාපිත වූ දියතලාව යුද්ධ හමුදා මූලික රෝහල ද මේ වන විට යුද්ධ හමුදා මූලික රෝහලක් ලෙස අවැසි වෛද්‍ය පහසුකම් සහිතව වැඩිදියුණුවී ඇති බැව් පෙන්වා දිය හැක. තවද යුද්ධ හමුදා හෙද විද්‍යාල මෙන්ම තවත් යුද්ධ හමුදා රෝහලක් හා මූලික රෝහල් 05 ක් අද වනවිට දිවයින පුරා ව්‍යාප්ත වී තිබේ.

සාඩම්බර ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය, වර්තමානය වන විට සිය පරිපාලන කටයුතු විධිමත්ව ඉටුකිරීම සඳහා රෙජිමේන්තු මධ්‍යස්ථානය, නිත්‍ය ඒකක 04ක් සහ ස්වේච්ඡා ඒකකයක් ලෙස ස්ථාපිත කර ඇත. එසේම යුද්ධ හමුදා රෝහල් 02 කින් හා යුද්ධ හමුදා මූලික රෝහල් 06 කින් සිය වෘත්තීමය දායකත්වය ලබාදෙමින් මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩල 05 කින් සමන්විතව, යුද්ධ හමුදාව තුළ වඩා විධිමත් වෛද්‍ය සේවාවක් ඉටු කිරීමටද වෛද්‍ය බලකාය සමත්ව සිටී.

එදා මෙදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 09 දෙනෙකු බලකාධිපති ධූරය හෙබවූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායෙහි වර්තමාන බලකාධිපති ලෙස මේජර් ජෙනරාල් එස්එච් මුණසිංහ ආර්ඩබ්පී ආර්එස්පී විඑස්වි යූඑස්පී කටයුතු කරන අතර, එම ජ්‍යෙෂ්ඨ නිලධාරී යුද්ධ හමුදා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජෙනරාල් වශයෙන්ද රාජකාරීන් ඉටුකරනු ලබයි.

*ඉදිරිපත් කිරීම, රෙජිමේන්තු මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකාය*

"ගෙවුණු අවුරුදු තුන හතරට මේ පැතිවල ඇතිවෙලා තියෙන වෙනස හැබැහින් දකින කෙනෙක් ඇරෙන්න වෙන කවුරුත්නම් විශ්වාස කරන එකකුත් නැහැ දයාවංශ"

ඉද්ද ගැසුවා සේ විහිදී ඇති කාපට් ඇතිරූ මාවත දිගේ සෙමින් සෙමින් පියවර තබන අතරේ ජයසේන සිය හඬ අවදි කළේය.

"ඒක ඇත්ත ජයසේන, වෙන අයට තියා අවුරුදු පහළොවක් විස්සක් මේ බිමේම කරක් ගහපු අපිටවත් හිතාගන්න පුලුවන්ද? ඒ කොහොම උනත් මුළු රටේම මිනිස්සු සාමයෙන් සතුටින් ජීවත්වෙනව දකින එක මේ භෞතික සංවර්ධනයට වඩා මට වටිනවා. අපි කරපු කැපකිරීම්වලට වටිනාකමක් ලැබෙන්නෙ එතකොටයි"

දයාවංශ බොහෝ හැඟිම්බර විලාසයෙන් පවසන්නට වූයේ හාත්පස විපරම් කරමිනි.

# අපි ණය නෑ

# දයාවංශ



"දයාවංශට ඔය ඉස්සරහ හංදිය මතකද..?"

අත දිගුකරමින් ජයසේන පැවසුවේ දයාවංශගේ අවධානය එක එල්ලේ ඒ දෙසට යොමුකරවමිනි.

"හොඳට හුරුබවක් දැනෙනව ජයේ. එත්"

"මේ තමයි නැදුන්කේනි හංදිය. ඔතනදි තමයි දයාවංශ උඹට වෙඩි වැදුනෙ" "මොනවා! ඒ දවස්වල මේ දෙපැත්තෙම හද්ද කැලේ. කොයිතරම් වෙනස් වෙලාද..?"

දයාවංශ විස්මිත්තව පවසන්නට වූයේ දෙඅත් හිසෙහි රුවා ගනිමිනි.

"මෙතන විතරක් නෙමෙයි රටේ හැමතැනම වෙනස්වෙලා. මුලතිව්, කිලිනොච්චි, යාපනේ මේ හැමතැනම වෙනස් වෙලා. එදා ලේ හලාගෙන එකාපිට එකා වැටිල යුද්ධ කරපු තැන්වල අද ඒ සලකුණක්වත් නැහැ. අපි උදාකරල දුන්න සාමයෙන් උපරිම ප්‍රයෝජන අරගෙන තිස් අවුරුද්දක් නොතිබ්ච්ච සංවර්ධනය අද මේ පැතිවලට එන්න පටන් අරගෙන. අර බලපන් ගෙවල් දොරවල් කඩ සාප්පු ඉදිවෙලා තියෙන අපූරුව"

දයාවංශගේ හිත බොහෝ දුර ගොස්ය. දෙපස වැවුණු ලඳුකැලෑ, දූවිලි පිරුණු මාවත්, බෝම්බ, වෙඩි සද්ද, මර ලතෝනි මේ සියල්ල සිතුවම් පෙළක් සේ ඔහුගේ මනසෙහි ඇඳෙන්නට විය.

"උඹට වෙඩි වැදුන හැටි මතකද දයාවංශ?

ජයසේනගේ එවදන් දයාවංශට වසර දහයකට ආසන්න වූ අතීතය නැවත මෙනෙහි කරන්නට බලකරන සෙයකි.

"වෙඩි වැදුණ තැනට වෙනකල් මතකයි. ඇත්තටම ජයසේන ඊට පස්සෙ මට මොකද වුනේ "

"වැලිඔයෙන් පටන් ගත්තට පස්සේ "ඔට්ටියමලේ" හරහා ආපු ගමනෙ වැදගත්ම තැන වුනේ මෙතනයි. උඹට වෙඩි වැදුනම අපි හැමෝගෙම ජීවිත කඩා වැටුණ වගේ දැණුන. ඒ වෙලාවේ අපි කාටවත් ඔලුව උස්සන්න බැරි තරමට උන් ගැහුවා. උඹව ගන්න ගිහිල්ලා අපේ දෙන්නෙක් බරපතල විදියට තුවාල වුනා. උඹව කරේ තියාගෙන මම මීටර් 200 ක් විතර බඩගෑවා. පස්සෙ ට්‍රැක්ටරයක දාගෙනයි කෑම්ප් එකට අරගෙන ගියේ. ඇම්බියුලන්ස් එකක් මගට ඇවිත් තිබුණත් ඒ පාරවල්වල ඒකට යන්න බැහැ. වේලාසනින් උඹව කෑම්ප් එකට අරගෙන යන්න පුළුවන් වුනානම් උඹ තාමත් ජීවත්වෙනව දයා"

"එතකොට ජයසේන උඹට මොකද වුනේ. මම කලින් හිතාගෙන හිටියෙ උඹ ජීවත් වෙනව කියල."

"මටත් ඒ වාසනාව ලැබුනේ නෑ දයාවංශ. එත් මට වෙඩි වැදුණෙ උඹ නැතිවෙලා මාස දෙක තුනක් පහුවෙලයි. එදා නැදුන්කේනි වලින් පස්සෙ අපිට වැඩිපුරම සටනක් තිබුණෙ "ඔඩ්ඩුසුඩාන්වල". අපි ගියේ මේ පැත්තෙන්. ඔඩ්ඩුසුඩාන් හංදිය අල්ලන්න අපිට දවස් තුන හතරක් විතර එක දිගට ගහගන්න වුනා"

"ජයසේන එතකොට අපේ අනිත් උන්ට කරදරයක් උනේ නැද්ද?"

"මේ මොනව අහනවද දයාවංශ, නන්දිකඩාල් වෙනකල් වැඩි දෙනෙක් අපිත් එක්ක හිටියා. එත් අන්තිම හරියෙදි අපේ අයත් බුරුතු ගණන් නැති වුනා. කොහොම වුනත් අන්තිම ටිකේ පුදුම හැඟීමකින් තමයි අපි සටන් කළේ. මරණ බයක් දැනුනෙම නැති ගානයි"

"උඹට වෙඩි වැදුනෙ කොතනටද ජයසේන..?"

"මේ තියෙන්නෙ. මට එකක් නොවෙයි වෙඩි තුනක්ම වැදුනා. උරහිසටයි, කලවටයි. අන්තිම එක වැදුණෙ පපුවට. පළවෙනි එක වැදිලත් මම සටන අතහැරියෙ නෑ ජයේ. අපි නන්දිකඩාල් කලපුව වටකරපු වෙලාවෙ උන්ට කරකියා ගන්න බැරුවයි හිටියෙ. හරියට උදේ 06.00 විතර ඇති. අන්තිම හරිය නිසා උනුත් වියරු වැටිලයි හිටියෙ. ඒ වෙලාවෙ ඒ පොඩි සීමාව තුළ වුනත් තැන් කීපයකම ලොකුවට සටන් ඇවිලුනා. උඹට මතකද ජයේ මැල්සිරිපුර ගජසිංහ, එතකොට නිලන්ත, පොළොන්නරුවේ සමරසිංහ උන් ඔක්කොම හිටියෙ මගෙ ටීම් එකේ. නිලන්තට වෙඩි වැදිල පස්සට අරගෙන ගියෙත් එතනදිමයි. මට ඒ වෙලාව හොඳට මතකයි. උන්ගේ බුරුතු පිටින් එකා පිට එකා මැරිල වැටුණ. උනුත් සටන අත හැරියෙ නැහැ. මම හිතන්නෙ ප්‍රභාකරන් හිටියෙත් එතන කියලයි. අපි හතර පැත්තෙන්ම වටකරල තිබුණේ උන් කාටවත් පැනගන්ඩ

බැරි විදියටයි"

"උඹට වෙඩි වැදිලත් පස්සට ගියේ නැද්ද ජයේ ?"

"ඒ වේලාවේ මට හොඳට සිහිය තිබුණා. තුවාලකාරයෙක් උනත් පස්සට ගන්න තරම් පරිසරයක් එතන තිබුණෙ නැහැ දයා. අන්තිම සටන ඇවිලුණු වෙලාවෙ එතන මම වගේ අපේම තුවාලකරුවො ගොඩක් හිටියා. තුවාල පිටින්ම වුනත් හැමෝම එකාවගේ සටන් කලා.

"අපිටත් තේරුණා ඒ අන්තිම සටන බව. කොටින්ගේ ෆයර් එක ටිකෙන් ටික අඩුවෙන්න ගත්තා. අපි දැනගත්තා අන්තිම සටනේ අවසන් ජයග්‍රහණය ලැබෙන්න ආසන්න බව. ඒ වෙලාවෙ කලපුව අයිනෙ හිටපු අපේ කෙනෙකුට වෙඩි වැදිලා කලපුවට වැටුන දැක්ක. සටනේ අන්තිම මොහොත නිසා මට පුදුම ආවේගයක් දැනුනෙ. මම තුවාල පිටින්ම හිටපු තැනින් නැගිටලා කලපුවට බැහැල ඉස්සරහට යන්න හැදුවා. එතකොටම කලපුව පැත්තෙන් ආව වෙඩි උණ්ඩයක් මගේ පපුව හාරගෙන ගියා. මටත් මතක එච්චරයි දයාවංශ"

ජයසේන දිගු සුසුමක් පිටකරමින් පවසන්නට විය. ඔහුගේ හඬ බොහෝ හැඟුම්බරවී ඇත. දෙනෙත් අග කඳුළු බිඳු දෙකක් මෝදු වෙමින් තිබිණ.

> **"මට මැරුණු එක ගැන කණගාටුවක් නෑ දයා. ඒත් අන්තිම සටනේ අවසාන පෙනි පෙනී සමුගන්න වුන එක ගැනයි කණගාටුව"**

"මට මැරුණු එක ගැන කණගාටුවක් නෑ දයා. එත් අන්තිම සටනේ අවසානය පෙනි පෙනී සමුගන්න වුන එක ගැනයි කණගාටුව. අන්තිම ත්‍රස්ත්‍රවාදියත් විනාශ කරල මුළු රටම නිදහස් කරගෙන ඒ වෙනුවෙන් මුළු රටේම ජනතාව ඔල්වරසන් නගන හැටි, ප්‍රීතිවෙන හැටි දැකල ඇස්දෙක පියාගන්න තිබුන නම් කොයිතරම් වාසනාවක්ද දයා"

"ගිය දේවල් ගැන දැන් හිතන්න එපා ජයේ. අපි කාගෙත් ඉරණම ලියවිලා තිබුන විදියට හැමදේම සිද්ද වුනා එච්චරයි"

දයාවංශ හා ජයසේන අතර බොහෝ වේලාවක් පැවතියේ නිහැඩියාවකි. අරමුණකින් තොරව ඉදිරියට ඇවිද ගිය ඔවුහු අතීත මතක සැමරුම පිරි බොහෝ තැන් පසුකර "ඒ-9" මගට අවතීර්ණ වූහ.

"ජයසේන අර මිනිස්සු වටවෙලා ඉන්නෙ මොකද....?"

ඔවුන් ඇවිද යන මාවතේ ඉදිරිය පෙන්වමින් දයාවංශ පැවසුවේය.

"ඔය තියෙන්නෙ අලිමංකඩ ස්මාරකය. ඒ දවස්වල අලිමංකඩ ජයග්‍රහණය අපේ සටනේ වැදගත්ම සංදිස්ථානයක්. පැති කීපයකින් ආව අපේ අය එකතුවුනේ ඔතනදි. දැන් ඔතන හදල තියෙන ස්මාරයක බලන්න නිතරම සෙනග එනවා"

ජයසේන හා දයාවංශ සෙමින් සෙමින් ඒ දෙසට කිට්ටු වූහ.

"මේ මහත්තුරු කොහෙද..?"

දයාවංශ එහි සිටි එක් අයෙකුගෙන් විමසීය.

අපිද ? එක දිහාවක කියලා නෑ මල්ලි. හැමතැනම කට්ටිය මේ වෑන් එකේ ඉන්නවා"

මැදි වියේ පසුවන අයෙකු දයාවංශ දෙස හැරී තරමක් උස් හඬින් පැවසීය. අව් කන්නාඩි දෙකක් පැලඳ සිටි ඔහු විදේශිකයෙකුට සමාන සිරුරකින් හෙබි අයෙකු විය.

"මේ මහත්තුරු මේ පැත්තේ ආපු පළවෙනි වතාව ද මේ ?"

"මොනව අහවද මල්ලි. පසුගිය කාලේ යුද්දෙනෙ. මෙහෙ එන්ඩ පුලුවන්ද. අපේ අපේ මැදවච්චියෙන් මෙහාට ඒ දවස්වල ආවනං "බොඩිස්"තමයි. මල්ලිලා මේ හරියේම ද ඉන්නේ"

ඔහු පෙරලා දයාවංශගෙන් ප්‍රශ්න කළේය.

"හ්ම්... ලඟමත් නොවෙයි. එත් අපි මෙහෙට ඇවිත් නම් ගොඩක් කල් වෙනවා"

"ඕගොල්ලෝ හමුදාවනේ. ඒ හින්දා මොනවා උනහම මොකෝ. අපි එහෙමද මල්ලි අඹු දරුවො හැමතැනම ලක්ෂ ගණන් බිස්නස් අතර මග. දැන් මේ වෑන් එකේ ඉන්නවා ඔස්ට්‍රේලියාවේ, ඇමරිකාවේ මගේ යාළුවෝ සෙට් එකක්. උන් වැකේෂන්වලට විතරයි ලංකාවට එන්නෙ. ඒ ආවම ඉතින් "ෆන්" එකක් ගන්න පොඩ්ඩක් ඇවිදිනව. පසුගිය කාලෙ අපි ගියේ බදුලු බණ්ඩාරවෙල, ගාල්ල මාතර. මේ වතාවේ තමයි මෙහෙ ආවේ. දැන් අවුලක් නැනෙ මල්ලි. බෝම්බ නෑ, වෙඩි නෑ, හැබැයි කට්ට අව්ව තමයි ඉවසන්න බැරි මල්ලි"

දැත් දෙපසට විහිදුවමින් විරාමයක් නොතබාම පවසන ඔහුගේ වදන් දයාවංශ හෝ ජයසේනට කිසිදු ලෙසකින් ප්‍රියතාවයක් ඇති නොකලේය. සුළඟ සමග මුසුව ඔහුගේ මුවින් නික්මෙන මත් පැන් ගඳ දයාවංශට ඉහිලුම් නැති විය. කිසිදා ඉර එළියක් නොවැටුනුසේ දිස්වන ඔහුගේ සිරුරෙන් දහඩිය වැගිරෙමින් තිබිණ. ඒ සමගම වෑන් රථයෙන් බැසගත් තවත් අයෙකු ඔහු වෙතට පැමිණියේය.

"ජගත් ඇතුලේ බඩු ඉවරයි. කොහෙද ගන්න තියෙන්නෙ."

"කිලිනොච්චි ටවුන් එකේ ඇති. මුලතිව්වලට හැරෙන්න කලින් දෙක තුනක් දාගම්මු, ආ මචං, කැමරාවෙ බැට්‍රි බැහැල අළුත් බැට්‍රි දෙකකුත් දා ගනින්. ආතල් ෆොටෝ ටිකක් ගන්න පුලුවන් ඒ පැත්තේ ගියාම. හෙතෙම සිය පසුම්බියෙන් ගත් අළුත්ම මුදල් නෝට්ටු කිහිපයක් අනෙකා අත තබමින් පැවසීය.

මල්ලි ගන්නවද මොනවා හරි. අඩු තරමේ බියර් එකක්. මේවා මෙහෙ ලෝකල් නොවෙයි ෆොරින් බඩු."

ඔහු වෑන් රථයේ පිටුපස විවරකොට ඉවතට ගත් බෝතලයක් දයාවංශ හා ජයසේන වෙතට දිගු කරමින් ඇසුවේය.

"බොහෝම ස්තුතියි අපි බොන්නෙ නෑ"

"අයියෝ අයියෝ මල්ලි හමුදාවේ වුනාම ඔයිට වඩා ෆෝවර්ඩ් වෙන්න එපායැ"

"අපි වුවමනා තැන්වලදී ෆෝවර්ඩ් වුනා මහත්තයා. ඒවයේ ප්‍රතිඵල තමයි අද ඔය භුක්ති විඳින්නේ"

ඒ සමගම කාන්තාවක් සමග වෑන් රථයෙන් බැසගත් තවත් අයෙකු එහිවූ ස්මාරකයට ගොඩවී ඡායාරූප ගැනීමට සූදානම් වනු පෙනිණ. කොණ්ඩය කර තෙක් වවා කරාබුවක් ද පැළඳ සිටි එහි වූ පිරිමියා ද බැලු බැල්මට කාන්තාවකට සමානය.

"ඡ්....ඡ් මහත්තයා ඔය ස්මාරයකය උඩට ගොඩ වෙන්න එපා. ඕක බොහෝම පූජනීය තැනක්. අපේ කොල්ලෝ සිය දහස් ගානක් ජීවිත පූජා කරපු ඓතිහාසික තැනක් මෙතන. වෙන අය මෙතනට ආපුවාම වැඳලයි යන්නෙ"

තවදුරටත් බලා සිටිය නොහැකි තැන දයාවංශ හඬ අවදි කළේය.

"සොරි සොරි මල්ලි අපි එච්චර හිතුවේ නැහැ. කවුද දන්නේ මේ වගේ තැන් එච්චර වැදගත් කියලා"

ඒ සමගම පන ගැන්වූ වෑන් රථයේ නලා හඬ ඇසෙත්ම බිම සිටි කිහිපදෙනා කඩිමුඩියේ රථ ගොඩවන්නට වූහ.

"එහෙනම් මල්ලි අපි යනවා. මේක හොඳට බලාගන්න තව තව කට්ටිය මේකට නගින්න බලයි."

වෑන් රථයේ දොර වසන අතරේ කවුලුවෙන් හිස හොවා එහි සිටි අයෙකු අවඥා සහගත අයුරින් කියූ එවදන් ඇසීමෙන් දයාවංශට ඉහිලුම් නැතිවිය. ඔහුගේ සුරත කිටි කිටියේ තද වී පියවරක් ඉදිරියට තබත්ම ජයසේන ඔහු වලකා ලීය.

"ඕවා ඔච්චර හිතන්න එපා දයාවංශ. හැමෝටම රට ගැන එකවගේ හැගීමක් නැහැ. එහෙම තිබුණනම් මේ වගේ යුද්ධයක් ඇතිවෙන්නෙත් නැනෙ."

ජයසේන ඔහු අස්වසාලමින් කීය. එහෙත් දයාවංශ සැහැල්ලු වන බවක් පෙනෙන්ට නැත.

"අපි මේ රට නිදහස් කළේ මේ වගේ නරුමයන්ට පිස්සු කෙලින්නද ජයේ. උඹයි මමයි වගේ දහස් ගණනක් ජීවිත පූජා කළේ මේ රට නිදහස් කරල මුන්ට භාරදෙන්න ද?"

"සන්සුන් වෙයන් දයා. ඔය ප්‍රශ්නෙට උත්තරයක් මම පස්සේ දෙන්නම්. දැන් අපි යමු"

බොහෝ ආයාසයෙන් දයාවංශ මෙල්ල කරගත් ජයසේන ඉදිරියට පියවර තැබුවේය.

............................................................................................

"දරුවනේ පිස්සුමෙන් බහින්න. මෙතන කලබල කරන්න එපා. බොහෝම පූජනීය තැනක් මෙතන. ඔය පොඩි පන්තිවල ළමයි ඉස්සරහට වෙන්න"

විදුහල්පතිවරයාගේ කාරුණික විධානයට ළමෝ මෙන්ම සෙසු ගුරුමණ්ඩලයද පෙළ ගැසෙන්නට වූහ. බස්රථ දෙකක් පුරා ළමුන් සියගණනකින් සැදි නඩය අලිමංකඩට සේන්දු වූයේ බොහෝ දුරක් ගෙවා දමමිනි.

"මොකක්ද සර් මෙතන තියෙන වැදගත්කම"

සටහන් පොත් ද අතැතිව සිටි ළමෝ විදුහල්පතිවරයා වටා රොක්වෙමින් විමසන්නට වූහ.

"මේ තමයි හසලක ගාමිණී වීරයාගේ පිළිරුව. අපි අර එනකොට කෝකාවිල්වලදී බැලුවේ කපිතාන් අලදෙනිය රණවිරුවගෙ ස්මාරකය. මෙතනත් ඒ වගේ වීරයෙක් බිහිකරපු තැනක්"

විදුහල්පතිවරයා ආඩම්බරයෙන් කරන පැහැදිලි කිරීම එහි සිටි සැමෝම මහත් උවමනාවෙන් සවන් දෙන්නට වූහ.

"මේ ළමයි හොඳින් තේරුම් ගන්න. මැරෙන බව දන දනත් රට වෙනුවෙන් සටන් කරලා ජීවිත පූජා කළ වීරවරයෙක් තමයි මේ හසලක ගාමිණී කියන්නේ. ඒ උත්තමයා සිහිවෙන්නයි මේ ස්මාරකය හදල තියෙන්නෙ. මැත ඉතිහාසේ මේ වගේ රණවිරුවෝ සිය දහස් ගණනක් බිහිවෙලා තියෙනවා. ඒ හැම රණවිරුවෙකුටම පිංසිද්ධ වෙන්න තමයි අපි අද නිදහසේ ඇවිදින්නෙ. නිදහසේ හුස්ම ගන්නෙ. අපි මැරුණහම අපෙ දේහයත් එක්ක හැම දෙයක්ම වැලලිලා යනවා. නමුත් අමතක කරන්න එපා රට වෙනුවෙන් ජීවිත පූජා කළ කිසිම කෙනෙක් එහෙම වෙන්නෙ නැහැ. ඒ අය මැරුණට ඔවුන් ගැන මතකය මැරෙන්නෙ නෑ. මරන්නත් බැහැ. තව අවුරුදු සිය දහස් ගණන් ඒ අය ගැන කතා කරනවා. පොත් පත්වල ලියවෙනවා. මේ වාතලයෙ අපි ගන්න හැම හුස්ම පොදකම ඒ වීරුවන්ගෙ සුවඳ තැවරිලා තියෙනවා. මේ බිමේ හැම වැලි කැටයකම ඒ අයගෙ සටහන් ඇඳිල තියෙනවා."

විදුහල්පතිවරාගේ හැඟුම්බර පැහැදිලි කිරීම ඇතැම් දරුවන්ගේ හා ගුරු භවතුන් ගේ නෙතට කඳුලක්ද එකතු කළේය.

"දයාවංශ අහගෙන නේද හිටියෙ"

මෙතෙක් වේලා පසකට වී විදුහල්පතිවරයාගේ දීර්ඝ කතාවට සවන් දී සිටි ජයසේන දයාවංශ සමීපයට පැමිණ ඇසීය.

"ඔව් ඒ මහත්තයාගේ එක වචනයක් නෑ අහක දාන්න. මගෙ ඇස් දෙකටත් කඳුළු එන තරම්. පුදුම ආවේගයක් හිතට දැනෙන්නෙ. රටේ කී දෙනෙක් අපි කරපු මෙහෙවර අගය කරනවද. කී දෙනෙක් අපිට ගෞරව කරනවද. මේ දේවල් ඇහෙනකොට මට පුදුම සතුටක් දැනෙනවා"

දයාවංශ හිස් අහස දෙස එක එල්ලේ බලා සැහැල්ලු සුසුමක් පිටකළේ තම මෙහෙවර පිළිබඳ නිහතමානී ආඩම්බරයකින් යුතුවය. ජයසේන තුළද ඇතිවූයේ එම හැඟීමමය. ඔහු දයාවංශගේ උරහිසට අතක් තැබුවේය.

"දයාවංශ මගෙන් කලින් අහපු ප්‍රශ්නෙට උත්තරය මෙතන තියෙනවා. අපි රට වෙනුවෙන් ජීවිත පූජා කළේ මේ වගේ මිනිස්සු වෙනුවෙන්, මේ රට නිදහස් කරල දුන්නෙ මේ පොඩි එවුන්ගේ අනාගතය වෙනුවෙන්. එහෙම නැතිව උපන් බිම ගැන කිසි හැඟීමක් නැතිව අරක්කු බීබී රට වටේ යන අර නරුමයෝ වෙනුවෙන් නෙවෙයි. ඒ හින්දා අපි ජීවිතේ පූජා කරපු එක ගැන කවදාවත් පසු තැවෙන්න එපා දයාවංශ. එදා අපි දෙන්නා නොහිටියානම් වෙන කවුරු හරි අපි කළ මෙහෙවර කරයි. ඉතිහාසයේ ඉඳන් අපේ රට රකින්න කාලෙන් කාලෙට වීරයො බිහිවුණා. මේ යුගයේ හිටිය අපි. ඒ ඓතිහාසික වගකීම ඒ වෙලාවේ අපි පැහැර හැරිය නම් අනාගත පරපුර අපිට ශාප කරනවා සිකුරුයි. ඒ හින්දා ආඩම්බර වෙයන් දයා. අපි උපන් බිමට ණය නැහැ."

කාලය සෙමින් සෙමින් ගෙවී යන්නට විය. ඉද්ද ගැසුවා සේ දිවෙන **A - 9** පාරට මළ හිරු රැස් වැටෙමින් තිබේ. දයාවංශ හා ජයසේන එකිනෙකාට බොහෝ සමීපව ගමන් කලද ඔවුන් අතර ඇත්තේ දැඩි නිහඬ බවකි. අරමුණක් හෝ නිමාවක් නැති ඔවුන්ගේ ගමනේ තවත් දිනක් ගෙවමින් ඇත. බොහෝ දේ කාලය සමග ගෙවී ගියේය. ඔවුන් සුපුරුදු පරිසරයකට පිවිසියේය.

## "අයියෝ අයියෝ මල්ලි හමුදාවේ වුනාම ඔයිට වඩා ෆෝවර්ඩ් වෙන්න එපායැ"

## "අපි වුවමනා තැන්වලදී ෆෝවර්ඩ් වුනා මහත්තයා. ඒවයේ ප්‍රතිපල තමයි අද ඔය භුක්ති විඳින්නේ"

වල් වැදුණු සොහොන් පිටිය පුරා ඇත්තේ පාලු මුසල බවකි. මෑතකදී කිසිවකු එහි මිහිදන් කළ බවක් නොපෙනේ. දයාවංශ හා ජයසේන එකිනෙකාට සමීපව මද දුරක් සොහොන් පිටිය තුළට ගමන් කොට මුහුනට මුහුනලා ඉදිව තිබූ කුලුණු දෙකක් අභියස නතර වූහ. ලංකා සිතියමක හැඩයට සකසා තිබූ එම කුළුණු බැලූ බැල්මට රණවිරුවන් වෙනුවෙන් ඉදිව ඇති බව පෙනේ. දයාවංශ තමා අභියස තිබූ සොහොන් කොතේ සටහන්ව තිබූ අකුරු එකින් එක කියවන්නට විය.

"මානුෂීය මෙහෙයුමේ නියැලී සිටියදී නැදුන්කේනි ප්‍රදේශයේදී ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක්ව දයෙන් සමුගත් කෝප්‍රල් දයාවංශ පීඩී රණවිරුවා සිහිකිරීම වෙනුවෙන් වර්ෂ ......"

අවසන් අකුරු පෙළ කියවන්නට මත්තෙන් දයාංවංශ බොඳ වූ දෑසින් ජයසේන දෙස බැලීය. ඔහුද සොහොන් කුලුනට බොහෝ සමීප වී එහි දුර්වර්ණව ඇති සටහන් කියවන්නට උත්සාහ දරණු පෙනිණ.

"මානුෂීය මෙහෙයුම අවසන් අදියරේදී 2009 මැයි 18 දින නන්දිකඩාල් හිඳී සතුරු වෙඩි උණ්ඩයකට බිලිව දයෙන් සමුගත් සැරයන් ජයසේන කේඩීටී රණවිරුවා සිහිවීම පිණිසය."

සටහන කියූ සැනින් ජයසේනගේ දෑස් එල්ල වූයේ ඈත සිතිජය වෙතය. ඔහුගේ ඒ බැල්ම බොහෝ තියුණුය.

"දයාවංශ උඹට මතකද අර විදුහල්පතිතුමා කියපු කතාව"

දයාවංශ දෙස නොබලාම ජයසේන පැවසූ එවදන් තුළ තිබුණේ බොහෝ දැඩි බවකි.

"ඔව් මට මතකයි......... මට හොඳටම මතකයි"

"අපි මැරුණම අපේ දේහයත් එක්ක හැම දෙයක්ම වැලලිලා යනවා. නමුත් අමතක කරන්න එපා රට වෙනුවෙන් ජීවිත පූජා කළ කිසිම කෙනෙක් ගැන එහෙම වෙන්නේ නැහැ. ඒ අය මැරුනට ඔවුන් ගැන මතකය මැරෙන්නෙ නෑ. මරන්නත් බැහැ. තව අවුරුදු සිය දහස් ගණන් ඒ අය ගැන කතාකරනවා. පොත් පත් වල ලියවෙනව. මේ වාතලයෙ අපි ගන්න හැම හුස්ම පොදකම ඒ වීරුවන්ගේ සුවඳ තැවරිලා තියෙනව. මේ බිමේ හැම වැලි කැටයකම ඒ අයගෙ සටහන් ඇඳිල තියෙනවා."

විදුහල්පතිවරයා කී එවදන් දෝංකාර දෙමින් ඔවුනට නැවත නැවත ඇසෙන්නට වූහ. හිරු අවරට හැරී අවසානය. අන්දකාරය හාත්පස ගිල වවුල් රංචුවක් ක්‍රමයෙන් කුඩා වී අඳුර සමග නොපෙනී ගියේය. දයාවංශ හා ජයසේන ඒ දෙස බලා සිටියෝය.

නිමි.

**මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ**

# තල් අරඹේ කෞෂල්‍යය - 2019




යුද්ධ හමුදා සාමාජිකයින්ගේ නිර්මාණ කුසලතා හඳුනා ගැනීම හා ඒවා සමාජගත කිරීම තුළින් යුද්ධ හමුදාවේ අභිමානය වර්ධනය කිරීමේ අරමුණින් යාපනය ආරක්ෂක සේනා මූලස්ථානය වෙතින් සිව්වන වරටත් සංවිධානය කළ "තල් අරඹේ කෞෂල්‍යය - 2019" නව නිපැයුම් ප්‍රදර්ශනය ඉකුත් සැප්තැම්බර් මස 05 සහ 06 යන දෙදින පුරා යාපනය වීරසිංහම් ශාලාවේදී පවත්වන ලදී.

යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය ඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ යූඑස්ඒසීජීඑස්සී ගේ මඟපෙන්වීම යටතේ පැවති මෙම ප්‍රදර්ශනය සඳහා යුද්ධ හමුදා සාමාජිකයින් විසින් කළ නව නිපැයුම් 40 ක් ඉදිරිපත් කර තිබුණි. එම නිර්මාණ අතුරින් ප්‍රථම ස්ථානය 14 වන ගජබා රෙජිමේන්තුවේ සෙ/476759 කෝප්‍රල් දිසානායක ඩබ්ලිව්පීඩබ්ලිව් හටත්, දෙවන ස්ථානය 4 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සෙ/368320 කෝප්‍රල් ෆොන්සේකා ජීසීසීආර් හටත්, තෙවන ස්ථානය 7 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකායේ සෙ/725930 කාසෙ මල්ෂා එස්ඩීඑන් හටත් හිමිවූහ.



ඔවුන්ගේ කුසලතාවයන් වෙනුවෙන් තෑගි හා සහතිකපත් ප්‍රදානෝත්සවය ඉකුත් සැප්තැම්බර් මස 06 දින යාපනය වීරසිංහම් ශාලාවේදී පවත්වන ලදී. ප්‍රදර්ශනයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් උතුරු පළාත් ආණ්ඩුකාර ආචාර්ය සුරේන් රාඝවන් මහතා සහභාගි වූ අතර, යාපනය දිස්ත්‍රික් ලේකම්, උතුරු නාවික හමුදා ආඥාපති, 55 වන සේනාංකයේ සේනාංකාධිපති ඇතුළු සිවිල් හා හමුදා නිලධාරීන්, සෙසුනිලයින් විශාල පිරිසක්ද ඊට එක්වූහ.

# රණවිරුවන් වෙනුවෙන් හරවත් දේශනයක්



යාපනය බළප්‍රදේශයේ රාජකාරී කරනු ලබන යුද්ධ හමුදා නිලධාරීන්, සෙසුනිලයින් දැනුවත් කිරීමේ අරමුණින් වූ හරවත් දේශනයක් ඉකුත් සැප්තැම්බර් මස 06 දින යාපනය ආරක්ෂක සේනා මූලස්ථාන සිනමා ශාලාවේදී පැවැත්විණ. "ශ්‍රී ලංකාවේ ඉතිහාසය සහ නව සොයාගැනීම්" යන මාතෘකාව යටතේ වූ එම දේශනය ප්‍රවීන මහාචාර්ය රාජ්. සෝමදේව මහතා විසින් සිදුකරන ලදී.

යාපනය ආරක්ෂක සේනා මූලස්ථානයේ බ්‍රිගේඩියර් ප්‍රමානි බ්‍රිගේඩියර් පීජේපී ගමගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු මෙම දේශනය සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය සහ ඒ යටතේ රාජකාරී නියුතු යුද්ධ හමුදා නිලධාරීන්, සෙසුනිලයින් විශාල පිරිසක් සහභාගි වූහ.

# ඓතිහාසික දිනයක අභිමානවත් සැමරුම



512 බළසේනා මූලස්ථානයේ 24 වෙනි සංවත්සරය බළසේනාධිපති කර්නල් ඩබ්ලිව්එම්එච් රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් සැප්තැම්බර් මස 01 දින පවත්වන ලදී.

ඒ නිමිත්තෙන් සංවිධානය කෙරුණු සංවත්සර වැඩසටහන්වලදී යාපනය ශ්‍රී නාග විහාරයේදී පැවති ආගමික වතාවත්ද, බළසේනාධිපති වෙත සම්මාන මුරයක් පිළිගැන්වීමද, සියලු නිලයින් වෙනුවෙන් පැවති දිවාභෝජන සංග්‍රහයද ප්‍රධාන විය. තවද බළසේනාව යටතේ රාජකාරී කරනු ලබන නිලධාරීන් හා සෙනින්ගේ පරිත්‍යාගයෙන් යාපනය මහ රෝහලේ ලේ බැංකුවේ වෛද්‍ය කාර්ය මණ්ඩලයේ සම්බන්ධතාවයෙන් යාපනය ප්‍රදේශයේ රෝගීන් සඳහා ලේ දන්දීමේ වැඩසටහනක් එම මූලස්ථාන පරිශ්‍රයේදී පැවැත්වීමද විශේෂත්වයකි. තවද සෙබළුන්ගේ මානසික ඒකාග්‍රතාවය ඇතිකිරීම වෙනුවෙන් එදින රාත්‍රී අධිරිද්ම සංගීත ප්‍රසංගයක් ද පවත්වන ලදී. නල්ලූර් කෝවිලේ වාර්ෂික දේව මෙහෙයට සහභාගි වූ බැතිමතුන් වෙත පානීය ජල බෝතල් 400 ක් පරිත්‍යාග කිරීමද සංවත්සර වැඩසටහන් අතර විය.

## රූපලාවන්‍ය වැඩමුළුවක්





21 වන සේනාංකයේ සේනාංකාධිපතිගේ සංකල්පයකට අනුව එම සේනාංකයේ රාජකාරී කරනු ලබන කාන්තා නිලධාරිනියන්, කාන්තා සෙසුනිලයින් සහ අනුරාධපුර ප්‍රදේශයේ ජීවත්වන සිංහල හා මුස්ලිම් කාන්තාවන්ගේ රූපලාවන්‍ය දැනුම වර්ධනය කිරීමේ අරමුණින් වූ රූපලාවන්‍ය වැඩමුළුවක් ඉකුත් ජූලි 28 දින එම සේනාංක මූලස්ථාන ශ්‍රවණාගාරයේ දී පැවැත්විණ. ප්‍රවීණ මාධ්‍යවේදිනී සහ රූපලාවන්‍ය ශිල්පිනී සුරංගි කොඩිතුවක්කු මහත්මියගේ උපදේශකත්වයෙන් පැවැති එම වැඩමුළුවට **Off Marks** ආයතනයේ අනුග්‍රාහකත්වය හිමිවිය. එහිදී මෙම වැඩමුළුව සඳහා සහභාගි වූ සියලුම කාන්තාවන් හට වටිනා රූපලාවන්‍ය කට්ටලය බැගින් නොමිලේ පිරිනැමූ අතර, ඔවුන් සඳහා සහතිකපත්‍ර හිමිගන්වන ලදී. මෙම වැඩමුළුවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 21 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්පීඑන්කේ ජයපතිරණ ආර්එස්පී සහභාගි විය.

## රණවිරු එකමුතුවෙන් ලේ දන්දීමේ වැඩසටහනක්





52 සේනාංක මූලස්ථානය පිහිටුවා වසර 24 ක් සපිරිණ. ඒ නිමිත්තෙන් සේනාංකාධිපති බ්‍රිගේඩියර් එස්එස් වඩුගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් සංවිධානය කෙරුණු ලේ දන්දීමේ වැඩසටහනක් ඉකුත් අගෝස්තු මස 15 දින මිරුසුවිල්හි පිහිටි එම සේනාංක මූලස්ථානයේදී පවත්වන ලදී.



## 513 බළසේනාව සංවත්සර දිනය සමරයි



ඉකුත් අගෝස්තු 24 දිනට 513 බළසේනා මූලස්ථානයට වසර 24 ක් සපිරිණ. ඒ නිමිත්තෙන් ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් එහි බළසේනාධිපති ගේ ප්‍රධානත්වයෙන් වැඩසටහන් රැසක් පවත්වන ලදී. එහිදී බළසේනාධිපති කර්නල් ඒඑස්එම් ෆාරිස් යූඑස්පී වෙත සාම්ප්‍රදායානුකූලව කඳවුරු සම්මාන මුරය පිළිගැන්වීම, සියලු නිල දිවා භෝජන සංග්‍රහයක් හා සංගීත ප්‍රසංගයක් පැවැත්වීම සංවත්සර වැඩසටහන් අතර ප්‍රධාන විය.

# අකුරු කරන්නට රණවිරු අතහිත





643 බළසේනා මූලස්ථානය යටතේ ඇති 13 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ "සී" කණ්ඩායම් බලප්‍රදේශයට අයත් කරුපඩ්ඩමුරිප්පු විද්‍යාලයේ ඉගෙනුම ලබන දුවා දරුවන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ නැංවීමේ අරමුණින් පාසලේ සිසු සිසුවියන් 147 ක් සඳහා පාසල් පාවහන් බෙදාදීමේ මාහැඟි සත්කාරයක් ඉකුත් දා සිදුකෙරිණ. 64 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීසීකේ කොස්තා ආර්එස්පී යූඑස්පී ගේ සංකල්පයකට අනුව 643 වන බළසේනාවේ බළසේනාධිපති කර්නල් ජේඒඑම්එන්කේ ජයසුන්දර ආර්එස්පී යූඑස්පී ගේ පූර්ණ අධීක්ෂණයෙන් සිදුකෙරුණු මෙම සත්කාරයට ව්‍යාපාරික චරිත් විමලවීර යන අය විසින් මූල්‍ය අනුග්‍රහකත්වය දක්වන ලදී.

## දස්කම් විස්කම් පෑ විරුවෙක්





2019 වර්ෂයේ ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) වෙතින් පවත්වනු ලැබූ නව නිපැයුම් නිර්මාණ තරඟාවලියේදී සෙ/15එෆ්0740 ලා/කෝ ජයතිලක යූජ්ඩබ්ලිව්එම්ඩීබී යන කොනොනි විසින් නිර්මාණය කළ වේගවත් සංඥා පද්ධතිය සඳහා දෙවන ස්ථානය හිමිවිය. එම කොනොනි 2016, 2017 සහ 2018 වර්ෂ තුළදී ද නව නිර්මාණ ඉදිරිපත් කර ජයග්‍රහණ හිමිකරගෙන ඇති අතර, ශ්‍රී ලංකා නව නිපැයුම් සංගමය වෙතින් පවත්වන ලද තරඟාවලි සඳහාද සහභාගී වී යුද්ධ හමුදාවට, ගැමුණු හේවා රෙජිමේන්තුවට සහ 15 (සේවා) ගැමුණු හේවා බළඇණියට අති මහත් කීර්තියක් ගෙනදුන් අයෙකි.

## සුහදත්වය වර්ධනයට සංගීත ප්‍රසංගයක්





වව්නියාව වෙළඳ සංගමය හා මුස්ලිම් ප්‍රජාව සමග එක්ව 56 සේනාංකයේ භට පිරිස් විසින් සංවිධානය කරනු ලැබූ විචිත්‍රවත් සංගීත ප්‍රසංගයක් ඉකුත් ජූලි මස 06 දින වව්නියාවේදී පැවැත්විණ. ප්‍රදේශයේ ජනතාව අතර සාමකාමී වටපිටාවක් නැවත ස්ථාපිත කිරීමේ අරමුණින් සංවිධානය කෙරුණු මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස වව්නියා දිස්ත්‍රික් ලේකම් අයි.එම්. හනීපා මහතා සහභාගී විය. තවද වන්නි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේඑස් ගුණවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, 56 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්පී සෙනෙවිරත්න වීඑස්වී යූඑස්පී එන්ඩීයූ, බළසේනාධිපතිවරු, ඒකක අණදෙන නිලධාරීවරු ඇතුළු හමුදා සාමාජිකයින්, රාජ්‍ය නියෝජිතයින් හා ප්‍රදේශයේ ජනතාව විශාල පිරිසක් ඊට සහභාගී වූහ.

# 25 වසරක අභිමන් සමරා





ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) 25 වන සංවත්සරය එහි ආඥාපති මේජර් ජෙනරාල් අයිඩබ්ලිව් මාදොල ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් සැප්තැම්බර් මස 14 දින අභිමානවත්ව සමරන ලදී. එහිදී ආඥාපති වෙත සම්මාන මුරයක් සහ සම්මාන ආචාර පෙළපාළියක් පිරිනැමීම, සිවිල් සේවක මහතුන් වෙනුවෙන් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා මුල්ගල තැබීම සහ සියලුනිල තේපැන් සංග්‍රහය එම වැඩසටහන් අතර විශේෂයෙන් කැපීපෙනුණි.

## සුබ මොහොතින් නව ඉදිකිරීම් සෙසුනිල අයිතියට





10 වන විජයබාහු පාබල රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී මේජර් එච්එම්අයිකේ සමරනායක ශ්‍රීලංසිරෙ ගේ අදහසකට අනුව එම ඒකක නිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් ඉදිවූ ජන අවන්හලක් සහ මැහුම් හලක් පසුගියදා විවෘත කෙරිණ. එය එම ඒකකයට එතෙක් තිබූ විශාල අඩුපාඩුවක් සම්පූර්ණ වීමකි.

## නිලධාරීන් වෙනුවෙන් පුහුණු වැඩසටහනක්

663 බලසේනාව මගින් සංවිධානය කරන ලද නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහනක් 2 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේදී ඉකුත් අගෝස්තු මස 24 දින පවත්වන ලදී. 2 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ නිලධාරීන් දෙදෙනෙකු විසින් මෙහෙයවනු ලැබූ එම පුහුණු වැඩසටහන 66 වන සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් එම්ඩී විජේසුන්දර ආර්එස්පී ගේ අධීක්ෂණය මත සංවිධානය කෙරුණි. මේ සඳහා එම සේනාංකය යටතේ ඇති බලසේනා සහ ඒකකයන්හි නිලධාරීහු රැසක් සහභාගී වූහ.





# ඒකක සංචාරයක නිරත වෙමින්





පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ඉකුත් සැප්තැම්බර් මස 22 දින ශ්‍රී ලංකා පාබල හමුදා ඒකකයේ සංචාරයක නිරතවිය. එහිදී හෙතෙම එම ඒකකයන්හි නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ අවශ්‍යතා සහ ඔවුන්ගේ ඉදිරි අභිවෘද්ධිය සඳහා වූ සියලු පාලන කටයුතු විධිමත්ව සිදුකිරීම පිළිබඳව සොයාබැලීය. එදින ඔහු 23 ශ්‍රීලපාහ, 24 ශ්‍රීලපාහ සහ 5(සේවා) ශ්‍රීලපාහ යන ඒකකවල සංචාරය සිදුකරන ලදී. 24 ශ්‍රීලපාහ ඒකකයේ අභිවෘද්ධිය සඳහා ඉදිකිරීමට නියමිත දේශන ශාලාවට මුල්ගල තැබීම හා 5(සේවා) ශ්‍රීලපාහ ඒකකයේ අර්ධ ස්ථිර භට නිවාසයක් විවෘත කිරීමද රෙජිමේන්තු අධිපතිගේ එම ඒකක සංචාරය තුළ සිදුවූ විශේෂ අංග විය.

## FOXHILL CHESS FIESTA - 2019

## තරඟාවලියේ ජය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට



සැගවුණු සහ ප්‍රගුණ වෙඩික්කරු පුහුණු පාසල දියතලාව මගින් සංවිධානය කරනු ලැබූ අන්තර් ශ්‍රේණිගත චෙස් තරඟාවලිය ඉකුත් අගෝස්තු 30, 31 සහ සැප්තැම්බර් 01, 02 දිනයන්හිදී දියතලාව නරියකන්ද ප්‍රදේශයේදී පවත්වන ලදී. එම තරඟාවලිය සඳහා රණවිරු සෙවණ යුද්ධ හමුදා පුහුණු පුනරුත්ථාපන මධ්‍යස්ථානයට අනුයුක්තව දශක තුනක කුරිරු යුද්ධයෙන් තුවාල ලබා තම ශරීර අවයව මාතෘ භූමිය වෙනුවෙන් පරිත්‍යාග කොට තවදුරටත් රණකිතයට පත්ව පුනරුත්ථාපනය ලබන සෙබලු රැසක් සහභාගී වූහ. සෙ/419691 මා/සැ සමන්ත කේඩබ්ලිව් ආර්එස්පී (5 ගැහේබ), සෙ/418951 සැරයන් කුලරත්න ජේඩබ්ලිව්සීපී (9 ගැහේබ), සෙ/429889 කෝප්‍රල් දසනායක කේඩීඑස් (11 ශ්‍රීලපාහ), සෙ/372144 කෝප්‍රල් දේශප්‍රිය ආර්ඩබ්ලිව්වීඑස්කේ ආර්එස්පී (5 කරෙ), සෙ/418904 සාසෙ සාන්ත කුමාර ඒඑල්එන් (6 ගැහේබ) එම අයවලුන්ය. රණවිරු සෙවණ සේනාවිධායක බ්‍රිගේඩියර් ඩීවීපී කාරියවසම් ආර්එස්පී ගේ මගපෙන්වීම යටතේ එම තරඟාවලිය සඳහා ඉදිරිපත් වූ ඔවුහු එහිදී යුද්ධ හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව, විශ්වවිද්‍යාල මෙන්ම සිවිල් ආයතන නියෝජනය කළ සියලු කණ්ඩායම් අභිබවා රණකිත/ආබාධිත අයවලුන්ගේ ලකුණු සටහනේ පළමු ස්ථානය දිනාගැනීමට සමත් වූහ. රණකිතයින් වශයෙන් මෙම යුද්ධ හමුදා සෙබලුන් දක්වන ලද දක්ෂතාවය යුද්ධ හමුදාව ඉහළට ඔසවා තැබීමට මහත් පිටුවහලක් විය.

# අභිමානවත් සංවත්සර දිනය සමරමින්





1965 වර්ෂයේ සැප්තැම්බර් මස 01 දින ඓතිහාසික රුහුණු පුරවරයේ මාතර ලන්දේසි කොටුව තුළ දී ආරම්භ කරන ලද 3 (සේවා) ගැමුණු හේවා බළඇණිය දශක පහකට වැඩි දීර්ඝ ඉතිහාසයක් පසුකරමින් ඉකුත් සැප්තැම්බර් මස 01 දින සිය අභිමානවත් 54 වන සංවත්සරය සැමරීය. ඒකකයේ නිර්මාතෘ වූ එහි ප්‍රථම අණදෙන නිලධාරී කර්නල් සීජ් ධර්මපාල ඔබීඊ ඊඩී ගේ සිට ගෙවුණු අඩසියවසක් ඉක්මවූ කාලපරිච්ඡේදය තුළ අණදෙන නිලධාරීවරු 20 දෙනෙකු මෙම ඒකකයට නායකත්වය ලබාදී ඇති අතර, එහි වත්මන් අණදෙන නිලධාරී ලෙස මේජර් ඩබ්ලිව්ජ්කේදූ චන්දික කටයුතු කරයි.

# රණවිරුවන්ගෙන් ලේ දන්දීමේ කඳවුරක්





යුද්ධ හමුදා යුධෝපකරණ බළකාය වෙතින් සංවිධානය කරනු ලැබූ ලේ දන්දීමේ වැඩසටහනක් ඉකුත් අගෝස්තු මස 01 වන දින යුධෝපකරණ පුහුණු පාසලේදී පවත්වන ලදී. යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් හා රෙජිමේන්තු කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් එච්ජීඅයි විද්‍යානන්ද වීඑස්වී යූඑස්පී එන්ඩීසී එල්එස්සී ගේ අදහසකට අනුව මධ්‍යස්ථාන සේනාවිධායකගේ අධීක්ෂණයෙන් මෙම කටයුත්ත සිදුකෙරුණි. එම ලේ දන්දීමේ කඳවුර සඳහා රෙජිමේන්තු සාමාජිකයෝ විශාල පිරිසක් මහත් උනන්දුවෙන් සහභාගී වූහ.





# පාඨමාලාවට අත්වැලක්

ලාදුරු රෝහල - හේකිත්ත හි නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන් 40 දෙනෙකු වෙනුවෙන් කෙරෙන සුබසාධනයක් ලෙස ඔවුන්ගේ කොණ්ඩා කැපීමේ වැඩසටහනක් පසුගිය සැප්තැම්බර් මස 05 දින සිදුකෙරිණ. මේ සඳහා රණවිරු සම්පත් කේන්ද්‍රයෙහි කොණ්ඩා සැකසුම් හා රූපලාවන්‍ය පාඨමාලා හදාරනු ලබන සෙනින් ඉදිරිපත් වූහ. ඔවුනට ප්‍රායෝගික පුහුණුවක් ලබාදීමේ අරමුණ පෙරදැරිව සංවිධානය කරන ලද මෙම කටයුත්ත සේනාවිධායක බ්‍රිගේඩියර් ඒපීඅයි ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී යූඑස්පී ගේ මගපෙන්වීම යටතේ සිදුවිය.

# 25 වසක් නොනැවතී පෙරට



ගජබා රෙජිමේන්තු මූලස්ථාන බළඇණිය ආරම්භ කර ඉකුත් මැයි මස 27 දිනට 25 වසරක් සපිරිණි. ඒ නිමිත්තෙන් සංවිධානය කෙරුණු සංවත්සර වැඩසටහන අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එම්එස්සී පීරිස් ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජූනි මස 04 දින පැවැත්විණ. එහිදී ඒකකයේ මියගිය සාමාජිකයින් සමරා පැවැති ආගමික කටයුතුවලට මුල්තැනක් හිමිවූ අතර, අණදෙන නිලධාරී වෙනුවෙන් පිරිනැමුණු කඳවුරු මුරය හා සම්මාන පෙළපාලිය කැපී පෙණුනි.



තවද 25 වසරක ගමන්මග තුළ ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් තුවාල ලැබ ප්‍රතිකාර ලබන ඒකක සාමාජිකයන්ගේ මානසික සුවය උදෙසා මෙන්ම, මියගිය නිලධාරී හා සෙසුනිලයින් අනුස්මරණය කිරීමේ අරමුණින් ඔවුන්ගේ ලඟම ඥාතීන්ගේද සහභාගීත්වයෙන් යුතුව සර්වරාත්‍රික පිරිත් සජ්ඣායනාවක් සහ දානමය පිංකමක්ද සිදුකරන ලදී.

# පියෙන් පිය ආ මගෙහි අභිමන් සැමරුම





51 සේනාංකයේ 24 වන සංවත්සරය ඉකුත් අගෝස්තු මස 24 දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් සංවිධානය කෙරුණු වැඩසටහන් අතර යුද්ධයේදී තුවාල ලැබූ, දිවිපිදූ සහ දැනට සේවයේ යෙදී සිටින නිලධාරී, සෙසුනිලයින් සහ සිවිල් සේවක මහතුන් හට ආශිර්වාද පතා පැවති ආගමික වතාවත්වලට මුල්තැනක් හිමිවිය. තවද සේනාංකාධිපති බ්‍රිගේඩියර් බීඑච්ල් රත්නායක වෙත කදවුරු සම්මාන මුරයක් හා සම්මාන ආචාර පෙළපාලියක් පිරිනැමීම, සියලු නිල දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වීම එහිදී පැවති සෙසු වැඩසටහන් අතර කැපී පෙනුණි.

# සංවත්සර දින සමරා






ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ 10 වන සංවත්සරය ඉකුත් අගෝස්තු 19 දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එච්ඩීඑම්පී වීරසිංහ යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් වැඩසටහන් රැසක් පැවැත්විණ. එහිදී අණදෙන නිලධාරී වෙත කදවුරු සම්මාන මුරයක් පිරිනැමීම, ඒකකයේ නිලධාරී සහ සෙසුනිලයින් හට සෙත්පතා සෝමාවතිය පුදබිමෙහි බෝධිපූජා පිංකමක් පැවැත්වීම, සෙබලුන්ගේ සුහදතාවය වර්ධනය කිරීමේ අරමුණින් ක්‍රිකට් තරගාවලියක් පැවැත්වීම හා සියලු නිලයින් සඳහා පැවති දිවා භෝජන සංග්‍රහය ප්‍රධාන විය.

# දිවි නැගුමට විරු සත්කාරයක්

12 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් පීඩබ්ලිව්ඩීකේ ජයතිලක යූඑස්පී එන්ඩීයූ ගේ මැදිහත්වීම මත හම්බන්තොට වීරහෙල ග්‍රාමසේවා වසමෙහි ජීවත්වන දිළිඳු පවුල් සඳහා වියළි ආහාර පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් අගෝස්තු මස 22 දින සිදුකෙරිණ. මේ යටතේ මිරිස්, සීනි, මුංඇට, කඩල, තේ කුඩු, පොල් සහ පරිප්පු යන ආහාර ද්‍රව්‍ය අඩංගු වටිනා සලාක පාර්සල් ප්‍රදේශවාසීන් 100 දෙනෙකු අතර බෙදාදෙන ලදී. දානපතියෙකු වන කුරුණෑගල ශ්‍රී මුරුගන් ආයතනයේ කේ. එස්. කන්දරාජා මහතා මේ සඳහා මූල්‍ය දායකත්වය සැපයූ අතර, ආරක්ෂක සේනා මූලස්ථාන (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ජීජේඑල් වඩුගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී වීඑස්වී එන්ඩීයූ ගේ උපදෙස් හා මඟපෙන්වීම මත මෙම මානුෂීය කටයුත්ත සිදුවිය.



# සිතැවිලි සාගරය

## දුඹුරු නංගියේ

විදි පුරා අව් වැසි මැද
යටැසින් බලා දෑත පාන
ඈඩිවතේ පාට නොපෙනෙන,
නුඹට, කුසෙහි පැටියා බරද
නිදහස යදින
දුඹුරු නංගියේ....
පින්න මලක්ව දිළි සුදුමුණ
දුටුවන් වශීකළ නිල් දෑස
දෙවරක් බැලනෙ තුනුසපුව
හොරු අරන් හුගකල්ද
සෙනෙහස යදින
දුඹුරු නංගියේ....
නුඹ දිවිබර දෙගුණ කළ
ඔහු පාපතරයෙක් වන්ද
කලකදී අතුරුදහන් විද
කුණු කන්දකට යටවිද
ජීවිතය යදින
දුඹුරු නංගියේ....

*කසිතන් චුල්නාරා දිසානායක (ප්‍රා.ශි.)*
*හමුදාඩ්‍යාති ලේකම් කාර්යාලය*

## ඈය...

සුලලිත රේඛා
මවමින...
ලාලිත ගමනකි
හැඩවුණා...
කාටත් හොරැහින්
ගිලිහුණා...
ලෝහිත කඳුලකි
දෙනයන...

*සෙ/703926*
*ලා/ කෝ සම්පත් විජේසිංහ*
*අවි අබ - ශූන්‍ය*

## ගාමන්ට් කෙල්ලන්ට මේ කවි මල්...

රටතොට තැනක් නෑ ගාමන්ට් කෙල්ලන්ගේ
ඒ ගැන සිතා නුඹ මොකටද ලතවෙන්නේ
දහඩිය හලා දිව රෑ දෙක වෙහෙසෙන්නේ
පිටරට රුසිරු ලක් දෙරණට ගෙන එන්නේ

කැතවැඩ කරන අය ලෝකයෙ වැජඹෙන්නේ
ඒ ටික කලයි නෑ ඒවා හරියන්නේ
අරගෙන සවි සිතට මේ ගැන සිතමින්නේ
හයියක් රටට නංගියෙ නුඹ ගෙනඑන්නේ

යමෙක් කරන දේකට අපි බැටකනවා
එමගින් අපේ හොඳ නාමය වැනසෙනවා
ගාමන්ට් කෙල්ලෝ නොපනත් යැයි පවසනවා
මේටික හිතට ගෙන ඒ අය පන්නනවා

ඔබ වැඩබිමේ විතරක් නොව එහෙම අය
සැම තැන සිටිනවා රට තුළ ඔහොම අය
ගිණි අවි සමග පැන ගොස් හමුදාවෙ අය
නම කැත කරා විරුවන්ගේ මෝඩ අය

පැනි කාමරෙන් දරුවන් අරන් ගොසින්
ගුරුවරු අමන වුවා මම ඇසුව කතින්
සැම තැන සිටිනවා බලු වැඩ කරන එවුන්
ඒ ගැන සිතා යහ මග යමු සිත සතුටින්

*සෙ/104883 කෝප්‍රල් තයෝෂින් කේඩබ්ලිව්*
*ශුමාසේනා - ශූන්‍ය*

## නිහඬ විය....

වසර ගණනක පළපුරුදු ඇති
පුංචි සිගිතෙක් තනි මකන්නට ඇති
පුංචි පවුලම දුටු හීන තිබුනැති
ලොව දිනූ පියෙකු මා පතන්නැති

නිරුත් සඳු තරුත් නුඹ ගැන
දැනන් වුන් බව පසක් වුණා
වළා ගැබ නුඹ මිතුරු සඳ
මාරුතය ගත දැවටීම විඳ

පුහුණුවයි ජය මගේ පෙර මන්
අධිටනයි නුඹ හදේ දිරි දුන්
සහසකුත් සිත් පිරූ නුඹ තුටින්
හැඬවුවේ අද ඒ නෙත් කඳුලින්

උහන ගගන නිහඬව උන්නා
දිරිය අරන් දෙරණට පැන්නා
නුඹ රැකි බැලුනය එරෙහි උනා
දිවිය නිමාවක දොරපලු ඇරුණා

විහග තටු සලා ගගන මත
පා වුණා පොළෝ තල වෙත
දැනුණා මුත් වැරදුණු බව හිත
මත් කරන්නද සිපගනු හැර මිහිකත

ලක් මවුන් වෙනුවෙන්ම නුඹ පෙවී
රකින්නට දිනන්නට දිවියම උරදී
වින්දාද නුඹ රිදුම් මිහිකතට පතිත වෙද්දී
එපා කිසිදාක නුඹ අකලට පරවෙන්න සසරෙදී

**(පසුගියදා පැරෂුට් පුහුණු කටයුත්තක් අතරතුරදී හදිසි අනතුරකින් මියගිය රණවිරු චමින්ද කුමාරසිංහ වෙනුවෙනි)**

*කේ. ඩබ්ලිව්. මධූෂා විකුමාරච්චි*
*227, බෝපාගම, වේයන්ගොඩ.*

## ජීවිතයට ආදරය කරන්න

ජීවිතය කියන්නේ අවස්ථා දාමයකට මුහුණ දෙන එක. ඉපදුණු දවසේ ඉඳන් මෙලොව හැර යන දවස වෙනකල් අපට ඒ සඳහා අවදි ගණනාවක් පසුකරන්න වෙනවා. ඒ එක් එක් කාලවලදී මුහුණ පාන්න වෙන ගැටලු විවිධාකාරයි. සමහර අවස්ථා හොඳක් රසවත්, ඒ වගේම ජීවිතය එපාවෙලා දාල යන්න හිතුන අවස්ථාවනුත් බොහොමයි නේද? සමහර ගැටලු උත්සාහය හා කැපකිරීම වගේම බුද්ධිමත්ව හිතලා විසඳ ගන්න පුළුවන්. සමහර ඒවා කාලයටම ඉඩදීලා නිශ්ශබ්දව බලාගෙන ඉන්න වෙනවා. ඒ කොහොම උනත් ජීවිතය ලස්සනයි. අපි ඊට මුහුණ දෙන විදිය අනුවයි ජීවිතය විඳිනවද විඳවනවාද කියල තීරණය වෙන්නේ. චුට්ටක් පිළිවෙලට හිතුවානම්, ජීවිතය ලස්සනට පෙළ ගස්ස ගන්න පුළුවන්...

*ඉනූකා හේවාවිතාරණ*

## නුඹ...



*සෙ/1සෙ0567*
*ලා/ කෝ ඕ.බාර ආරච්චි*
*1 ශ්‍රීලංකා*
*අල්ලොකැලේ*




## විභාගය ෆේල්



කොල්ලෙක් විභාගෙ ෆේල් වෙච්ච නිසා බෙල්ලෙ වැල දාගන්න හදනකොට ඒ කොල්ලගෙ තාත්ත ආවලු ළගට...

**තාත්තා** - ඔහොම තැවතියන්... ඔය කඹේ කොහෙන්ද හොයාගත්තෙ කියපං...

**පුතා** - මේක අපේ රෙදි වැල තාත්තෙ...

**තාත්තා** - උඹේ අවාසනාව... උඹට අත්වෙන්නෙ භයානක මරණයක්...

**පුතා** - මොකක්ද තාත්තෙ ඒ කතාවෙ තේරුම...

**තාත්තා** - ආං උඹලගෙ අම්ම රෙදි වැල ගලවපු එකාව මරන්න හොයනවා...

## කසාදය



**ලංකානි** - රන්සිත මේ... මම විභාගෙ ෆේල් වෙන්න කියල ප්‍රාර්ථනා කරන්නකො...

**රන්සිත** - අර මොන ඉලව්වකටද?

**ලංකානි** - මොකද තාත්ත කිව්වා පළවෙනිය වුණොත් කාර් එකක් අරන් දෙනව කියල... දෙවනිය වුණොත් ලැප්ටොප් එකක් අරන් දෙනව කිව්ව... ෆේල් වුණොත් කසාදයක් බන්දල දෙනව කිව්වා...

## පිස්සන් කොටුව

**සිරිපාල** - ඩොක්ටර්... ඇයි අර අතන ඉන්න පිරිමි ළමය එයාගෙ ඔලුව හයියෙන් බිත්තියෙ ගහගන්නේ...

**ඩොක්ටර්** - එයා කසාද බඳින්න හිටපු ගෑනු ළමය වෙන කොල්ලෙක් එක්ක පැනල ගියා... ඒ දුකට පිස්සු හැදුන...

**සිරිපාල** - එතකොට අර ඊට එහා පැත්තෙ ඉඳන් ඔලුව හයියෙන් බිත්තියෙ ගහගන්න අනිත් පිරිමි ළමයට මොනා වෙලාද පිස්සු හැදුනේ...

**ඩොක්ටර්** - ආ... එයාද? ඒ තමයි අරෑගෙ කෙල්ලත් එක්ක පැනල ගිය කොල්ල...

## අඩි ගැසීම

**කමල්** - අපේ තාත්ත මුලු පඩියම අඩි ගහල ඉවර කරනවා...

**ඉන්දික** - අපේ තාත්ත මුලු පඩියම හම්බ කරන්නෙ අඩි ගහල...

**කමල්** - අඩි ගහනකොට කොහොමද බං සල්ලි ඉතුරු කරන්නෙ...?

**ඉන්දික** - ඇති හැත්තෙ... අපේ තාත්ත කරන්නෙ සපත්තුවලට අඩි ගහන එකනෙ...

## දුර පෙනීම



**චමීර** - මචං මට මේ ළඟකදි ඉඳන් පොඩි අවුලක් තියෙනව...
**සුගත්** - ඒ මොකෝ බං ඒ...?
**චමීර** - අනේ මංද බං මට මේ ළඟකදි ඉඳං දුර පේන්නෙ නෑනෙ...
**සුගත්** - ඇහ්... එහෙමෙද එහෙමනං කියපං බලන්න අර මොකක්ද කියල...
**චමීර** - ඇයි බං ඒ හඳනෙ...
**සුගත්** - අන්න ඒකනෙ කියන්නෙ... උඹට එච්චර දුර පෙනිලත් මදිනෙ...

## කාර් සිහිනය



**ඩිලාන්** - අඩෝ ශිරාන්... මම කාර් එකක් ගන්න හදන්නෙ... මට පොඩි ගානක් මදි බං... උඹට පුලුවන්ද දෙන්න...?

**ශිරාන්** - හරි... දැන් උඹ ගාව කීයක් තියෙනවද...?

**ඩිලාන්** - වාහන සේල් එකට යන්න ත්‍රීවීල් එකට රුපියල් 100 ක් හොයා ගත්ත... ඉතුරු ටික තමයි ඉතිං...

## සැමියගෙ ආදරය



**දමිත්** - උඹේ වයිෆ්ට උඹ මාර ආදරෙයි නේද බං...

**කසුන්** - ඇයි බං එහෙම ඇහුවෙ...

**දමිත්** - උඹ ගොඩක් ආදරේ නිසාදනෙ ෆෝන් එකේ වයිෆ්ගෙ නම වෙනුවට Bunny කියල දාල තියෙන්නෙ...

**කසුන්** - පිස්සුද බං... ඒකි මට කෝල් ගත්තොත් මට බනින එකමයි වැඩේ... ඒකයි Bunny කියල දැම්මෙ...




***English Vision*** පාඩම් මාලාව ඔස්සේ ***Art of the language*** (භාෂාවේ කලාව) අධ්‍යයනය සඳහා "රණවිරුවා" මාසික සඟරාව මගින් ඔබ හමුවට ගෙන එන තවත් එක් සරල ඉංග්‍රීසි වාක්‍ය රචනක භාවිතය පිළිබඳව මෙම මස කලාපය තුළින් අවධානය යොමු කරමු.

## *Tempt to*

යම් කිසි කාර්යයක් පිළිබඳ විස්තර කිරීමේදී "**උත්සහ දරනවා, උත්සහ ගන්නවා**" ආදි ප්‍රකාශ කිරීමේදී මෙම වාක්‍යය රචනා භාවිතා වේ. උදාහරණ ආශ්‍රයෙන් අවබෝධකර ගැනීමට උත්සාහ ගනිමු.

Formula - සූත්‍රය

**Subject + Tempt to + Verb (infinitive) + Object + Rest.**
සබ්ජෙක්ට් + ටෙම්ප්ට් ටු + වර්බ්(ඉන්ෆිනිටිව්) + ඔබ්ජෙක්ට් + රෙස්ට්.
කර්තෘ+ උත්සහ දරනවා, උත්සහ ගන්නව + ක්‍රියා පදයේ මූලික ස්වරූපය + කර්මය + ඉතිරිය.

Ex/උදා :-

1. I tempt to speak about that matter.
   අයි ටෙම්ප්ට් ටු ස්පීක් අබවුට් දැට් මැටර්.
   මම ඒ කාරණය ගැන කතා කරන්න උත්සාහ දරනවා.

2. He tempts to explain some things.
   හි ටෙම්ප්ට්ස් ටු එක්ස්ප්ලේයින් සම්තින්ග්ස්.
   ඔහු යම්දෙයක් ගැන විස්තර කිරීමට උත්සාහ දරනවා.

3. She tempts to open a new book shop.
   ෂී ටෙම්ප්ට්ස් ටු ඕපන් අ නිව් බුක් ෂොප්.
   ඇය නව පොත් කඩයක් විවෘත කිරීමට උත්සාහ ගන්නවා.

Nota Bene/සැ.යු :-

ඉහත වාක්‍යයෙහි අර්ථය හා භාවිතයන් පිළිබඳ සැලකීමේදී,

- Subject :- කර්තෘ පදය ( Singular - He ඔහු, She ඇය, It ඌ) හෝ බහුවචන ( Plural - I මම, We අපි, You ඔබ/ඔබලා, They ඔවුන්) යන අවස්ථා දෙකෙහිම පද මෙම රචනා සමග භාවිතා කළ හැක.

- Tempt to :- "උත්සාහ දරනවා, උත්සහ ගන්නවා "ආදි වශයෙන් අර්ථය ගැනීම සඳහා මෙම වචනය බහුවචන කතෘපද (Plural Subjects - I මම, We අපි, You ඔබ/ඔබලා They ඔවුන්) සමග භාවිතා වේ. තවද, Tempts to - ඒකවචන කර්තෘපද (Singular - He ඔහු, She ඇය, It ඌ) සමග භාවිතා වේ.

- Verb :- ක්‍රියා පදය (Infinitive) ක්‍රියා මූල පදයක් ලෙස පමණක් භාවිතා වේ.

- Object :- කර්ම පදය වශයෙන් කර්තෘ කරන ක්‍රියාවට භාජනය වන බලපෑම් ලබන පුද්ගලයෙකු හෝ පදයක් වේ නම් එය කර්ම පදය ලෙස වාක්‍යයෙහි ඒකවචන, බහුවචන භේදයකින් තොරව භාවිතා වේ.

- Rest :- ඉතිරිය වාක්‍යයෙහි කර්තෘ, ක්‍රියාව, කර්මය ආදී වශයෙන් පිළිවෙලින් යෙදී කාලය හඟවන පද වේ නම් ඒවා ඉතිරිය ලෙස වාක්‍යයෙහි අග භාවිතා වේ.

<u>Analysis of the sentence formation - වාක්‍යය රචනාවෙහි සැකැස්ම විශ්ලේෂණය.</u>

**Subject + Tempt to + Verb (Infinitive) + Object + Rest.**

සබ්ජෙක්ට් + ටෙම්ප්ට් ටු + වර්බ් (ඉන්ෆිනිටිව්) + ඔබ්ජෙක්ට් + රෙස්ට්.

කර්තෘ + උත්සහ දරනවා, උත්සහ + ක්‍රියාපදයේ මූලික ස්වරූපය + කර්මය + ඉතිරිය.

I tempt to speak about that matter.
අයි ටෙම්ප්ට් ටු ස්පීක් අබවුට් දැට් මැටර්.
මම ඒ කාරණය ගැන කතාකරන්න උත්සාහ දරනවා.

***English vision*** නව පාඩම් මාලාවක් ඔස්සේ ඔබගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය සඳහා "රණවිරුවා" මීළඟ කලාපය සමග එක්වන්න. තවද ඔබට මග හැරුණු පාඩම් අධ්‍යයනය කිරීම සඳහා පහත දී ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.



කපිතාන් චමින්ද ලියනගේ - ශ්‍රීලපොදුසේබ
සංඥා පුහුණු පාසල - බුවැලිකඩ
www.englishvision.lk



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා
බළසේනාවේ සේනාවිධායක ලෙස
**මේජර් ජෙනරාල්**
**එච්ච් ධර්මරත්න ඩබ්ලිව්ඩබ්ලිව්ව**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ**
**පීඑස්සී**
2019 සැප්තැම්බර් මස 16 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථානය
යාපනය ආඥාපති ලෙස
**මේජර් ජෙනරාල්**
**පීආර් වනිගසූරිය එච්එස්ච යූඑස්පී**
**එන්ඩියු යූඑස්ඒසීජීඑස්සී**
2019 ජූලි මස 15 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථානය
මුලතිව් ආඥාපති ලෙස
**මේජර් ජෙනරාල්**
**එච්ජේ සෙනෙවිරත්න**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ**
2019 සැප්තැම්බර් මස 16 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



53 සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
**මේජර් ජෙනරාල්**
**ජීජේ ගමගේ ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී යූඑස්පී එන්ඩිසී**
2019 සැප්තැම්බර් මස 16 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



57 සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
**මේජර් ජෙනරාල්**
**බීපීඑස් ද සිල්වා ආර්එස්පී**
2019 සැප්තැම්බර් මස 02 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු




නිලධාරී ප්‍රගමන ප්‍රවර්ධන
මධ්‍යස්ථානයේ
සේනාවිධායක ලෙස
**බ්‍රිගේඩියර්**
**කේජේ ජයවීර ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස්**
2019 සැප්තැම්බර් මස 16 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



පාබල පුහුණු මධ්‍යස්ථානය
මින්නේරිය
සේනාවිධායක ලෙස
**බ්‍රිගේඩියර්**
**එච්එම්ටීබී හංගිළිපොල**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**
2019 සැප්තැම්බර් මස 12 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



53 සේනාංකයේ නියෝජ්‍ය
සේනාංකාධිපති ලෙස
**බ්‍රිගේඩියර්**
**එච්කේජීආර් කොඩිතුවක්කු**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**
**අයිජීඑස්සී**
2019 සැප්තැම්බර් මස 09 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



ශ්‍රී ලංකා යුද්ධ හමුදා
යුධෝපකරණ බළකායේ
මධ්‍යස්ථාන
සේනාවිධායක ලෙස
**කර්නල්**
**එස්එන්ව් දිසානායක ඒටීඕ**
2019 අගෝස්තු මස 15 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



515 බළසේනාවේ
බළසේනාධිපති ලෙස
**කර්නල්**
**ටීකේඩබ්ලිව්පේ විජයසිරි**
**ආර්එස්පී**
2019 සැප්තැම්බර් මස 02 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



571 බළසේනාවේ
බළසේනාධිපති ලෙස
**කර්නල්**
**බීකේවස්කේ දොලගේ යූඑස්පී**
**පීඑස්සී**
2019 සැප්තැම්බර් මස 04 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



ගජබා රෙජිමේන්තු
මධ්‍යස්ථානයේ මධ්‍යස්ථාන
සේනාවිධායක ලෙස
**කර්නල්**
**එල්එච්එම් රාජපක්ෂ**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**
2019 අගෝස්තු මස 01 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



553 බලසේනාවේ
බලසේනාධිපති ලෙස
**කර්නල්**
**එම්කේඑස්එස්පී ජයසිංහ**
**ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී**
2019 අගෝස්තු මස 30 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



653 බලසේනාවේ
බලසේනාධිපති ලෙස
**කර්නල්**
**එල්ජ්පීඑල්බී උඩෝවිට**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**
2019 මැයි මස 14 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



593 බලසේනාවේ
බලසේනාධිපති ලෙස
**කර්නල්**
**ඩබ්ලිව්එම්පීඩබ්ලිව්ඩබ්ලිව්බීආර්**
**පාලමකුඹුර ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී**
2019 සැප්තැම්බර් මස 04 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



රෙජිමේන්තු මූලස්ථාන
බලඇණිය ගජබා රෙජිමේන්තු
අණදෙන නිලධාරී ලෙස
**ලුතිනන් කර්නල්**
**එම්එස්සී පීරිස් ආර්එස්පී**
**යූඑස්පී**
2019 අගෝස්තු මස 20 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථානය
(මුලතිව්) කර්නල්
(පාලන/හකාස) ලෙස
**ලුතිනන් කර්නල්**
**කේපීයූටී ජයසිංහ**
2019 සැප්තැම්බර් මස 02 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථානය
(යාපනය) මානි 1(පාලන) ලෙස
**ලුතිනන් කර්නල්**
**අයිආර් හන්තානාරච්චි**
2019 අගෝස්තු මස 22 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



6 ශ්‍රී ලංකා යුද්ධ හමුදා
පොලිස් සේවා බළකායේ
අණදෙන නිලධාරී ලෙස
**මේජර්**
**ජේඑස් ජයතිලක යූඑස්පී**
2019 අගෝස්තු මස 20 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



2(සේ) ශ්‍රී ලංකා යුද්ධ හමුදා
වෛද්‍ය බළකායේ අණදෙන
නිලධාරී ලෙස
**මේජර්**
**ආර්ඒඩබ්ලිව් විජයසිංහ**
2019 අගෝස්තු මස 05 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



දහතුන්වන වියට පා තබන
**නෙතුමි තිසෂණා ජයලත්**
**දියණියට**
සුබ උපන් දිනයකට ආසිරි
පතන්නේ ආම්මා හා තාත්තා
ඇතුලු පවුලේ සැම
(සෙ/513703 බනි 1
එම්ජීඑන්එම් ජයලත් ආර්එස්පී
යූඑස්පී)



දෙවන වසරට පා තබන
**සෙනුදි දෙහන්සා ගුණසේකර**
**දියණියට**
සුබ උපන් දිනයකට ආසිරි
පතන්නේ ආම්මා හා තාත්තා
ඇතුලු පවුලේ සැම
(සෙ/කිහු108657
සාසෙ ගුණසේකර
ආර්ඩබ්ලිව්එම්එම්එස්)



සිව්වන වසරට පා තබන
**එස්පී තිනුප් දෙව්සර පුතුට**
සුබ උපන් දිනයකට ආසිරි
පතන්නේ ආම්මා හා තාත්තා
ඇතුලු පවුලේ සැම
(සෙ/701854 බනි 11
චිත්‍රානන්ද එස්පී)



සිව්වන වසරට පා තබන
**ඒඑම් කේතක යසස්වි පුතුට**
සුබ උපන් දිනයකට ආසිරි
පතන්නේ ආම්මා හා තාත්තා
ඇතුලු පවුලේ සැම
(සෙ/677400 මා/සැ
අමන්දකෝන් ඒඑම්ජ්පී - පියා,
සෙ/59641 කෝප්‍රල් පෙරේරා
ඩීඩබ්ලිව්එස් - මව)

# දිවි නොතකා දිවි සුරැකි අභීත පුතුන්









"රණවිරුවන්ගේ මෙහෙවර යුද්ධයට පමණක් සීමා නොවේ . එසේම එය කිසියම් ජාතියකට, ප්‍රදේශයකට පමණක් සීමාවන්නේද නැත. එය වූ කලී සර්වකාලීන මෙහෙවරකි. මෙම සිදුවීම හරහා යලි යලි සනාථ වනුයේ යුද සෙබලුන් යනු දේශයේ මුරදේවතාවුන් බවයි. රණවිරුවාහි මේ උපහාරය එම අභීත පුතුන් වෙනුවෙනි"

ඉකුත් සැප්තැම්බර් 07 දින කිලිනොච්චි ප්‍රදේශයේ පිහිටි අරසපුරකුලම් වැවෙහි දියනාමින් සිටි මවක් සහ දරුවන් දෙදෙනෙකු හදිසියේ දියේ ගිලීමෙන් අනතුරට පත්වූහ. එහිදී ඔවුන් උදව් ඉල්ලා කෑගසමින් සිටි අවස්ථාවේ යාබද කඳවුරෙහි සේවය කරමින් සිටි සෙබලුන් දෙදෙනෙකු ක්ෂණිකව ක්‍රියාත්මක වී තමන්ට සිදුවිය හැකි ජීවිත අවධානම ගැනද නොතකමින් වැව්දිය සමඟ අසීරු සටනක නිරතව අවසානයේ එම මව සහ දරුවන් දෙදෙනාගේ ජීවිත බේරාගැනීමට ක්‍රියා කළහ. එහිදී ඉමහත් පරිශ්‍රමයක් දරමින් ගොඩට රැගෙන ආ එම තිදෙනාට එහි රැස්වූ සෙසු අයවලුන්ගේද සහයෙන් අවශ්‍ය මූලික ප්‍රථමාධාර ලබාදී ඔවුන්ව රෝහල්ගත කිරීමට කටයුතු කරන ලදී.

ඉහත ක්‍රියාවට මූලිකත්වය ගත් විරෝධාර සෙබලුන් වූයේ 5(සෙව්) යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවට අයත් ලා/කෝ අමරසිරි ඩීජීඑස් සහ ලා/කෝ ආරියරත්න ටීජීජේපී යන අයයි. මොවුන්ගේ තවත් විශේෂත්වයක් වූයේ මෙම අභීත සෙබලුන් දෙදෙනාම එකම ගමෙහි, එකම පාසලෙහි සහ දැනට එකම කඳවුරෙහි රාජකාරි කරන සෙබලුන් වීමයි.


## ප්‍රකාශනය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය



**අධීක්ෂණය**
බ්‍රිගේඩියර් ආර්ඩබ්ලිව්ආර් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඉඩ්සී



**උපදේශකත්වය**
ලුතිනන් කර්නල් එන්ඩබ්ලිව් කාරියකරවන
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඉඩ්සී - පීඑස්සී



**ප්‍රධාන සංස්කාරක**
මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ - ශ්‍රීලපාහෙ



**සහාය සංස්කාරක**
කපිතාන් කෑෂී ගෝඨාභිතාරක - ශ්‍රීලපුහමු



**සෝදුපත් කියවීම**
කපිතාන් ඩීඩබ්ලිව් දිල්හාරා සමීරනී - ජාගිම

## පරිගණක අකුරු සංයෝජනය, කවර නිර්මාණය හා පිටු සැකසුම

සෙ/752159 සාජන් ජේනාරත්න පීජී - 3 ඉංජේර
සෙ/753797 ලාන්ස් කෝප්‍රල් කුමාරසිංහ එච්එච්එම් - 11 ඉංජේර
සෙ/2061045 ලාන්ස් [illegible] - 11 ඉංජේර



## රණවිරුවා ලිපිනය

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය
යුහමු උතුරු පර්ශදය
නුවරපාර, දළුගම, කැලණිය.

## ඊමේල්

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

දුරකථන - 011 2993076
යුහ දිගුව - 55162/55163

රණබිමේ මතක

# "ඇවිදින ආමරිය"

ක්‍රියාන්විත බිමේ හැම රණවිරුවෙක් ළඟම ආයුධයක් තිබුණා. සමහර සෙබලු ළඟ ගබඩාවක තරම් ආයුධ තිබුණා. හරියට ඒ අය ඇවිදින ආමරියක් වගේ. සතුරු භූමියේදී අවශ්‍යතා මතුවෙන්නෙ ක්‍ෂණිකව. ඒ වෙලාවට කිසි දෙයක් අමුතුවෙන් හොයහොයා ඉන්න බෑ. සතුරු බලමුළු බිඳල ඉදිරියට යනකොට ඔවුන්ගෙන් එල්ලවන අභියෝගවලට මුහුණ දෙන්න අපේ රණවිරුවෝ පෙර සූදානමින් හිටියෙ එහෙමයි.

අවිආයුධ එක්ක සෙල්ලම් භයානකයි. ඒව හරියට පරිහරණය නොකලොත් අනුන්ට විතරක් නෙමෙයි තමන්ටත් හානි වෙන්න පුළුවන්. ඒ අවධානම දරාගෙන අකුරටම අරමුණ වෙනුවෙන් කැපවෙන්න හැමෝටම බෑ. ඒ දේ කරන්න පුළුවන් රණවිරුවෙකුට විතරමයි.

